# ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.

## VII සභා වාරය පනස් පස්වන මාසික සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.
දිනය : 2022.09.13.
වේලාව: පෙ.ව. 10.00.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ ගරු සභාපති එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදි.

මෙදින සහභාගීත්වය:

01. ගරු සභාපති - එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා.
02. ගරු උප සභාපති - එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා.
04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා.
07. ගරු ප්රාදේශීය සභා මන්ත්‍රී - එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - දෙවටගේ ධර්මදාස මැතිතුමා.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා.
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය
18.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය.
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය.
20.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා.
21.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා.
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා.
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා.

මෙදින සහභාගී නොවූ මන්ත්‍රීවරුන්:

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා.
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා.

නිලධාරි සහභාගීත්වය:

01. ලේකම් - ඩී.ඒ.සී.ආර්. දසනායක මිය.
02. සංවර්ධන නිලධාරි - ටී.ටී. රුවන්දිකා මිය.
03. සංවර්ධන නිලධාරි - ශකිලා දිනති තිලකරත්න මිය.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ VII සභා වාරයේ පනස් පස්වන සභාව සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්ම මහත්මීන් සහ මාධ්‍යවේදී මහතුන් ඇතුළු සියලු දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි. පෙ.ව. 10.00 ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## (01). පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් 2022.08.09. වන දින පැවැති මහ සභාවේ සභා වාර්තාව සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් 2022.08.09. වන දින පැවැති සභාවේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, දෙවටගේ ධර්මදාස මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

පිටු අංක 8 හි වෙනත් කරුණු හි
" ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශයේ කෘෂි කාර්මික කටයුතු වල නිරත වන විශාල ගොවිජනතාවක් පදිංචිව සිටියි. එහෙත් පොහොර සහනාධාරය බෙදා හැරීම, කෘෂි උපදෙස් ලබාගැනීමට ගොවිනියාමක නිලධාරින් මුණ ගැසීමට ක්‍රමවේදයක් නැහැ. ග්‍රාම නිලධාරින්ට, සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට, කාර්යාල පහසුකම් තිබුණත් ගොවි නියමාක නිලධාරින්ට කාර්යාල පහසුකම් නොමැතිවීම හේතුවෙන්, දුර බැහැර ප්‍රදේශවල සිට වසම් සඳහා පැමිණෙන නිලධාරින්ගෙන් උපදෙස් ලබා ගැනීම, මුණගැසිය හැකි දිනයක් හෝ රැඳෙන ස්ථානයක් නිශ්චිතව දැනගැනිමට ක්‍රමයක් නැහැ. එම නිලධාරින් සතියකට එක් දිනක් ගොවිජන සේවා මධ්‍යස්ථානට රැස් වෙයි. පින්නවල ප්‍රදේශයේ සිට පැමිණෙන ගොවි නියාමක නිලධාරි මහත්මයෙක් කුඹුරුතැනිවල වසමේ රාජකාරි කටයුතු සිදු කලත් එම නිලධාරිනිය සේවා කටයුතු කිරීමේ දී කාර්යාල පහසුකම් නොමැතිකම විශාල ගැටලුවක්. එම නිසා කාර්යාල පහසුකම් සලසා එම නිලධාරින් මුණ ගැසීමට ක්‍රමවේදයක් සලසන ලෙසට ඉල්ලා සිටිනවා. " යන සඳහන

" ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශයේ කෘෂි කාර්මික කටයුතු වල නිරත වන විශාල ගොවිජනතාවක් පදිංචිව සිටියි. එහෙත් පොහොර සහනාධාරය බෙදා හැරීම, කෘෂි උපදෙස් ලබාගැනීමට කෘ.ප.නි.ස. නිලධාරින් මුණ ගැසීමට ක්‍රමවේදයක් නැහැ. ග්‍රාම නිලධාරින්ට, සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට, කාර්යාල පහසුකම් තිබුණත් කෘ.ප.නි.ස. නිලධාරින්ට කාර්යාල පහසුකම් නොමැතිවීම හේතුවෙන්, දුර බැහැර ප්‍රදේශවල සිට වසම් සඳහා පැමිණෙන නිලධාරින්ගෙන් උපදෙස් ලබා ගැනීම, මුණගැසිය හැකි දිනයක් හෝ රැඳෙන ස්ථානයක් නිශ්චිතව දැනගැනිමට ක්‍රමයක් නැහැ. එම නිලධාරින් සතියකට එක් දිනක් ගොවිජන සේවා මධ්‍යස්ථානට රැස් වෙයි. පින්නවල ප්‍රදේශයේ සිට පැමිණෙන කෘ.ප.නි.ස. නිලධාරි මහත්මියක් කුඹුරුතැනිවල වසමේ රාජකාරි කටයුතු සිදු කලත් එම නිලධාරිනිය සේවා කටයුතු කිරීමේ දී කාර්යාල පහසුකම් නොමැතිකම විශාල ගැටලුවක්. එම නිසා කාර්යාල පහසුකම් සලසා එම නිලධාරින් මුණ ගැසීමට ක්‍රමවේදයක් සලසන ලෙසට ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත දන්වා යවන ලෙස ඉල්ලා සිටිනවා " ලෙසට සංශෝධනය විය යුතු බව ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

2022/09/13 වන අද දින පවත්වනු ලබන මහ සභා න්‍යාය පත්‍රයේ යථා පරිදි කල් දී ඇති යෝජනා අංක (05) (iv) හි " 2019 ජනාධිපතිවරණ මැතිවරණ කටයුතු සඳහා ඡන්ද මධ්‍යස්ථාන විෂබීජහරණය සහ අධීක්ෂණ කටයුතු සඳහා මැතිවරණ කාර්යාලය විසින් ලබා දුන් මුදලේ ඉතිරි මුදල සහා කාර්යාලය සඳහා සනීපාරක්ෂක ද්‍රව්‍ය මිලදී ගැනීමට වියදම් කිරීමට අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම "
යන සටහන,
" 2019 පාර්ලිමේන්තු මැතිවරණ කටයුතු සඳහා ප්‍රදේශයේ ඡන්ද මධ්‍යස්ථාන විෂබීජහරණය සහ අධීක්ෂණ කටයුතු සඳහා මැතිවරණ කාර්යාලය ලබා දුන් මුදලේ ඉතිරි මුදල සහා කාර්යාලයට අවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍ය මිලදී ගැනීමට අදාල ලිපිය ඉදිරිපත් කිරීම" ලෙසට සංශෝධනය විය යුතු බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව 2022.08.09. වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ සභා වාර්තාව සංශෝධන සහිතව යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

(02). ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.
ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
(i). දීර්ඝ කාලයක් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සංවර්ධන නිලධාරින් ලෙස සේවය කරමින් සිට අගෝස්තු මස 01 වන දින සිට වැලිගෙපොල ප්‍රාදේශීය සභාවට ස්ථාන මාරු වී ගිය ප්‍රධාන සංවර්ධන නිලධාරි යූ.ඩී.එන්. නිලන්ත පුෂ්ප කුමාර මහතා, ඉන්ද්‍රානි ජයලතා මහත්මිය වෙනුවෙන් උපහාර පිරිනැමීමට සුභ සාධක සංගමය කටයුතු යොදා ඇති බව සතුටින් දන්වා තිබෙනවා. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස තෙවතාවක් ඔවුන්ගේ ස්ථාන මාරුවීම් වළක්වාගැනීමට කටයුතු කලත්, සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාත්, ප්‍රධාන ලේකම්තුමාත් ස්ථිර ප්‍රතිපත්තියක රැඳී සිටිමින් ස්ථාන මාරුවීම් අවලංගු නොකරන බව මෙවර ප්‍රකාශ කල බැවින් මේ වනතුරු එම ස්ථාන මාරුවීම් අවලංගු කර ගැනීමට නොහැකි වුණා. එහෙත් ඉදිරියේදී ඔවුන්ගේ සේවය මෙම කාර්යාලයට ලබාගැනීම සඳහා එම ස්ථාන මාරුවීම් නැවත සකස් කරවා ගැනීමට ක්‍රියා කරනවා. ඔවුන්ට උපහාර දැක්වීමට සුභ සාධක සංගමය සැළසුම් කර ඇති අතර ඒ සඳහා දිනයක් සූදානම් කිරීමට නියමිත බැවින් මන්ත්‍රීවරුන්ට, සහ මන්ත්‍රීවරියන්ට කැමැත්ත පරිදි ඒ සඳහා දායකත්වය දැක්විය හැකි බව කාරුණිකව දන්වා සිටිනවා.

(03). මාසික මහ සභාවට ලැබී ඇති ලිපි පෙත්සම් සංදේශ හා සන්නිවේදන ඉදිරිපත් කිරීම.
(i). ග්‍රාම නිලධාරි වසම් ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර වශයෙන් කඩිනමින් සවිබල ගැන්වීමටත්, එහිදී සෑම ග්‍රාමනිලධාරි වසමක්ම ආවරණය වන පරිදි ග්‍රාමීය මට්ටමින් සියළු නිලධාරින් එක්ව ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කමිටු පිහිටවිය යුතු බවත්, මෙම කමිටු වල උපදේශකත්වයට ප්‍රදේශය නියෝජනය කරන ප්‍රාදේශීය මට්ටමේ මහජන නියෝජිතයන් දෙදෙනෙකු අනුගාමිකවරුන් ලෙස කමිටු කාර්යයන් සඳහා සහාය වියයුතු බවත්, කමිටුව මඟින් මන්දපෝෂණය අවම කිරීම, ජන ජීවිතය යථා තත්ත්වයට පත්කිරීම, ආර්ථික සවිබල ගැන්වීම හා ආහාර සුරක්ෂිත භාවය ඇති කිරීම මූලික අපේක්ෂාව බවත්, ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන සහ ආහාර සුරක්ෂා කමිටුව මඟින් බල ප්‍රදේශයේ සෑම ගෘහ කුටුම්බයක්ම ආවරණය වන පරිදි කෘෂි කාර්මික, වෙළඳ, සමාජ, සුභසාධන, සෞඛ්‍ය, පෝෂණ හා දිළිඳු පවුල් ඉලක්ක කරගනිමින් ආර්ථික ක්‍රියාවලියක් සැකසීම සඳහා මහජන නියෝජිතවරුන්ගේ සහයෝගය සහ දායකත්වය සපයා දෙන ලෙසත්, 2022.09.06. දිනැති රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 9/2022 දරණ ස්වදේශ කටයුතු චක්‍රලේඛය අනුව කමිටු පිහිටුවා එම තොරතුරු 2022.09.19. වන දිනට ප්‍රථම දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කලයුතු බව දන්වමින් ඉඹුල්පේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ලේකම්තුමිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලයේ දී පිහිටුවා තිබූ ග්‍රාමීය කමිටු අහෝසිවීමත් සමඟ සහනාධාර හා වෙනත් ද්‍රව්‍ය බෙදා හැරීමේ දී සමජය තුල ගැටලු රාශියක් මතු වුණා. ඔබතුමන්ලාත්, ඔබතුමියන්ලාත් නිරන්තරයෙන් ඒ පිළිබඳව මාසික මහ සභාවට යෝජනා සහ අදහස් ඉදිරිපත් කළා. වත්මන් ආණ්ඩුවේ පක්ෂ කිහිපයක් නියෝජනය වන බැවින් ඒ අනුව කොට්ඨාසභාර මහජන නියෝජිතවරු, නියෝජිතවරියන් තෝරා ගනිමින් කමිටු පිහිටුවනු ඇතැයි අපේක්ෂා කරන අතර, සංවර්ධන නිලධාරින් විසින් ඒ සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමටත් දැනුවත් කිරීමටත් පියවර ගන්නා බව දන්වා එවා තිබෙනවා. එම නිසා අවශ්‍ය සහයෝගය සහ දායකත්වය එම නිලධාරින්ට ලබා දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා අදහස් දක්වමින්,
ගරු සභාපතිතුමනි, එක් කොට්ඨාසසයකින් මහජන නියෝජිතවරු දෙදෙනෙක් තෝරා ගන්නා බව සඳහන් වී තිබුණා. එහෙත් රත්මලවින්න කොට්ඨාසයේ මහජන නියෝජිතවරුන් තිදෙනෙක් නියෝජනය වන නිසා ඒ පිළිබඳව වැඩිදුරටත් කරුණු සොයා බලන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය අදහස් දක්වමින්,
පක්ෂ නියෝජිතයන් කැඳවන්නේ කෙසේද?

ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,

මහජන නියෝජිතවරුන් දෙදෙනෙක් අනුසාශකවරුන් ලෙස දායකත්වය ලබා දිය යුතු බව දන්වා එවා තිබෙනවා. දේශපාලන පක්ෂ කිහිපයක් මධ්‍යම ආණ්ඩුව නියෝජනය කරන බැවින් මෙම කමිටු පිහිටුවීමේ දී පක්ෂ හා විපක්ෂ මහජන නියෝජිතවරු කැඳවන්නේනම්, රත්මලවින්න කොට්ඨාසය නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරු තිදෙනාම කැඳවන ලෙසට දැනුවත් කරමු.

(ii). බල ප්‍රදේශය තුල පිහිටි වසම් පහළොව සඳහා රාජකාරී කටයුතු වලට කෘ.ප.නි.ස. නිලධාරින් 09 දෙනෙකු අනුයුක්ත කර ඇති බවත්, එම නිලධාරීන්ට කාර්යාල පහසුකම් පවතින බවත්, බ්‍රහස්පතින්දා කාර්යාල දිනය බවත්, කාර්යාලය පවතින ස්ථානය, දිනය, වේලාව සඳහන් කරමින් ඉතිරි රජයේ වැඩ කරන දින හා අවශ්‍යතා පරිදි නිවාඩු දිනවලදී වසමේ ක්ෂේත්‍ර රාජකාරිවල නියැලිය යුතු බවට උපදෙස් ලබා දී ඇති බවත්, වසම් මට්ටමින් කාර්යාල පවතින ස්ථාන පිළිබඳව දැනගැනීම පිණිස එම ස්ථාන නම් කර එවන බව සඳහන් කරමින් කෘ.ප.නි.ස. නිලධාරින්ට කාර්යාල පහසුකම් සපයා දෙන ලෙසට ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමාගේ ඉල්ලීම පරිදි, ගොවිජන සේවා ප්‍රාදේශීය සංවර්ධන නිලධාරි පඹහින්නට ඉදිරිපත් කරන ලද ලිපිය හා බැඳී, පඹහින්න, ගොවිජන සේවා මධ්‍යස්ථානයේ, ගොවිජන සේවා ප්‍රාදේශීය සංවර්ධන නිලධාරි විසින් එවන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
මේ සම්බන්ධයෙන් අවශ්‍ය වැඩිදුර තොරතුරු ලේකම්තුමිය වෙතින් දැනගැනීමට කටයුතු කරන ලෙස දන්වා සිටිනවා.

(iii). මොරහැල අමුපිටිය මාර්ගයේ උඩවෙල ස.ණ.ස. අසල බිම් කොටසේ බස් නැවතුමක් ලෙස තාවකාලිකව ඉදිකර ඇති ගොඩනැගිල්ල මාර්ගයට බාධාවක් නොවන පරිදි, කොන්ක්‍රීට් කණු යොදා ස්ථිර ගොඩනැගිල්ලක් ලෙස ඉදිකර දීමට හෝප්වෙල් ආයතනය කැමැත්ත පල කරන බව ගම්වාසීන් ප්‍රකාශ කරන බැවින්, එම ගොඩනැගිල්ල ඉදිකරවා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
මෙම ඉදිකිරීම සඳහා සභා අනුමැතිය ලබා දීමට හැකියාවක් නැහැ. පොලිස් රථ වාහන කමිටුව විසින් මෙවැනි ඉදිකිරීම් සඳහා අවසරය ලබා දෙනු ලැබේ. එබැවින් බස් නැවතුම්පොළ ඉදිකිරීමට අවශ්‍ය අවසර ලබා දෙන ලෙසට පොලිස් රථ වාහන කමිටුව වෙත දන්වා යැවීමට කටයුතු කරනවා. මීට පෙර අවස්ථා කිහිපයකදී බස්නැවතුම්පොලවල් ඉදිකිරීම, මාර්ග දැන්වීම් පුවරු සවි කිරීම, අවධානම් සහිත ස්ථාන හරහා පාර මාරුවීම සඳහා සුදුඉර ඇඳීමට පියවර ගන්නා ලෙස පොලිස් රථ වාහන කමිටුවට දන්වා යවා තිබුණත්, එම යෝජනා සම්බන්ධයෙන් අවධානය යොමු නොවුණ බැවින්, කමිටුව රැස් නොවීම පිළිබඳව කණගාටුවට පත් වන බවත්, කඩිනමින් කමිටුව කැඳවීමට අවශ්‍ය කටයුතු සලසන ලෙසට සහකාර පොලිස් අධිකාරි රත්නපුර සහ බලංගොඩ, පින්නවල, පඹහින්න පොලිස් ස්ථානාධිපතිවරුන් වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.

(iv). නෙල්ලිවල, පස්සරමුල්ල සිට ඉඹුල්පේ දක්වා මාර්ගය, පිඩලිගන්නාවෙල, මැදහින්න, කළුවලමංකඩ, හරහා කෝට්ටෙයාකන්ද මාර්ගය, අටවක්වෙල විජයජෝති නාහිමි මාර්ගය යන මාර්ගයන්හි ඉදිරි සංවර්ධන කටයුතු කඩිනම් කර දෙන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ.ආර්. ජයානන්ද මැතිතුමා ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වමින්,
නෙල්ලිවල, පස්සරමුල්ල සිට ඉඹුල්පේ දක්වා මාර්ගය ලෝක බැංකු ආධාර යටතේ සංවර්ධනය කිරීමට නියමිත වුවත්, සංවර්ධනය නොවීම නිසා බස් රථ සහ වෙනත් රථ වාහන වලට ගමන් කිරීමට නොහැකි ආකාරයට මාර්ගය අබලන්ව පැවතීම හේතුවෙන් එම ප්‍රදේශවල ජනතාව දැඩි අපහසුතාවයට පත් වී ඇත. එබැවින් ඒ පිළිබඳව අමාත්‍යවරයා දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙසත්,
පිඩලිගන්නාවෙල, මැදහින්න, කළුවලමංකඩ, හරහා කෝට්ටෙයාකන්ද මාර්ගය කොන්ත්‍රාත්කරුවන්ගේ මන්දගාමී ක්‍රියා පිළිවෙත හේතුවෙන් සංවර්ධනය වී නොමැති බවත්, මාර්ග සංවර්ධන කටයුතුවලදී පාලම්

යෙදීම සහ එම ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක නොවීම, මාර්ග කාපට් කර සංවර්ධනය නොකිරීම, කඩිනමින් මාර්ග කොන්ක්‍රීට් කර සංවර්ධනය නොකිරීම නිසා ජනතාව දැඩි අපහසුතාවයට පත්ව ඇති බවත්,
අටවක්වෙල විජයජෝති නාහිමි මාර්ගය අවිධිමත් ආකාරයට සංවර්ධනය කිරීම නිසා ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්, කොට්ඨාසය නියෝජනය කරනු ලබන මහජන නියෝජිතවරයා ලෙස මමත්, රජයත් අපහසුතාවයට පත්වීමත්, දැඩි දෝෂාරෝපනයට ලක්ව ඇති බවත්,
අවිධිමත් ලෙස සංවර්ධනය කරන ලද මාර්ග පිළිබඳව අදාල අංශ දැනුවත් කලත්, ඒ සඳහා යහපත් ප්‍රතිචාර නොලැබුණු බවත්,
එම නිසා මෙම මාර්ග සංවර්ධන කටයුතු පිළිබඳව නැවත අවධානය යොමු කර ඒ පිළිබඳව මහා මාර්ග අමාත්‍යවරයා දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙසට ඉල්ලා සිටිනවා.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
නෙල්ලිවල සිට පස්මුල්ල මාර්ගයත්, කංචිගුණේ මාර්ගයත් ලෝක බැංකු ආධාර යටතේ සංවර්ධනය කිරීමට නියමිතයි. මේ අවස්ථාව වන විට කිංචිගුණේ මාර්ගයේ සංවර්ධන කටයුතු ආරම්භ වී තිබෙනවා. එබැවින් නෙල්ලිවල සිට පස්මුල්ල මාර්ගයත් ඉදිරියේ දී සංවර්ධන කටයුතු ආරම්භවීමට නියමිත බව සතුටින් දන්වා සිටිනවා.
එමෙන්ම එම කොට්ඨාසයේ සංවර්ධනය කිරීමට නියමිත අනෙකුත් මාර්ග කඩිනමින් සංවර්ධනය කිරීමට පියවර ගන්නා ලෙසට දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ ගරු සභාපති, අකිල සාලිය එල්ලාවල මැතිතුමාටත්, මහා මාර්ග අමාත්‍ය බන්දුල ගුණවර්ධන මැතිතුමාටත් දන්වා යැවීමට කටයුතු කරනවා.

(04). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.
කිසිවක් ඉදිරිපත් වී නැත.

## (05). යථා පරිදි කල් දී ඇති යෝජනා.

(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට 2023 වර්ෂය සඳහා ආදායම් අයකර ගැනීමට අදාලව ඉදිරිපත් කරන ලද ගැසට් පත්‍රය සභා අනුමැතිය සඳහා ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.
අනතුරුව ගරු සභාපතිතුමා නැවතත් ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,
රටතුල උද්ගතවී තිබෙන ආර්ථික අර්බුධය හේතුවෙන් ජනතාව පීඩාවට පත්ව ඇත. මේ නිසා සභාවට ආදායම් රැස් කිරීම සඳහා ගාස්තු සංශෝධනය කිරීමට බලාපොරොත්තු නොවන අතර ඒ සඳහා නම්‍යශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමටත්, ගාස්තු වැඩිකර ඒවා ජනතාවගෙන් අයකරගැනීමකින් තොරව වියදම් පාලනය කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදි.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට 2022 වර්ෂය සඳහා ආදායම් අයකරගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ගැසට් පත්‍රයම සංශෝධනයකින් තොරව 2023 වර්ෂයේ ආදායම් රැස් කිරීමේ ගැසට් පත්‍රය ලෙස සභා සම්මත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට 2022 වර්ෂය සඳහා ආදායම් අයකරගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ගැසට් පත්‍රයම සංශෝධනයකින් තොරව 2023 වර්ෂයේ ආදායම් රැස් කිරීමේ ගැසට් පත්‍රය ලෙස සභා සම්මත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ii).** ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව නමින් බලංගොඩ ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 2247304 සහ 2247306 සඳහා දෙවන අත්සන්කරු ලෙස කටයුතු කල කේ.ජී. ඉන්ද්‍රානි ජයලතා මහත්මිය ස්ථාන මාරු වී ගොස් ඇති බැවිනුත්, සභාවේ ගිණුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යා යුතු බැවිනුත්, ඒ වෙනුවට ඒ.එස්.ටී.ඩී. අමුවල මහතා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව පත්කර ඇති බැවිනුත්, ඒ මහතා චෙක්පත් අත්සන් කිරීමේ දී දෙවන අත්සන්කරු ලෙස පත්කිරීමට අදාලව ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

චෙක්පත් අත්සන් කිරීම සඳහා දෙවන අත්සන්කරු ලෙස ඒ.එස්.ටී.ඩී. අමුවල මහතා පත් කිරීම සුදුසු බව ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි

ඒ අනුව, චෙක්පත් අත්සන් කිරීම සඳහා දෙවන අත්සන්කරු ලෙස ඒ.එස්.ටී.ඩී. අමුවල මහතා පත් කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(iii). සභාව සතු RW – 4358 සහ RV – 3020 අංක දරණ ට්‍රැක්ටර් ටේලර් දිරාපත් වී අබලන් තත්ත්වයට පත්ව ඇති බැවින්, එම ට්‍රැක්ටර් ටේලර් තීන්ත ආලේප කර සම්පූර්ණ අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට අවශ්‍ය බැවින්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවීමෙන් අනතුරුව සභා අරමුදලින් ට්‍රැක්ටර් ටේලර් අලුත්වැඩියා කිරීමට අදාලව ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවීමෙන් අනතුරුව, සභා අරමුදලින් සභාව සතු RW – 4358 සහ RV – 3020 අංක දරණ ට්‍රැක්ටර් ටේලර් තීන්ත ආලේප කර සම්පූර්ණ අලුත්වැඩියා කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි

ඒ අනුව, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවීමෙන් අනතුරුව, සභා අරමුදලින් සභාව සතු RW – 4358 සහ RV – 3020 අංක දරණ ට්‍රැක්ටර් ටේලර් තීන්ත ආලේප කර සම්පූර්ණ අලුත්වැඩියා කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

(iv). 2020 පාර්ලිමේන්තු මැතිවරණ කටයුතුවලදී ප්‍රදේශයේ ඡන්ද මධ්‍යස්ථාන විෂබීජහරණය හා විෂබීජහරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා මැතිවරණ කාර්යාලය විසින් ලබා දුන් මුදලින් රු. 33 205.00 ක මුදලක් ඉතිරිව ඇති බැවිනුත්, මැතිවරණ කාර්යාලය විසින් එම මැතිවරණ කටයුතු වලට අදාල ගිණුම් පියවා අවසන් බැවිනුත්, ඉතිරි වූ මුදල නැවත ආපසු හරවා යැවීමට ක්‍රමවේදයක් නොමැති බැවිනුත්, විෂබීජහරණ අධීක්ෂණ ක්‍රියාවලියේ නොයෙදුණු බැවින් එම මුදල් ඒ සඳහා ලබාගත නොහැකි බැවිනුත්, එම මුදල් සභා කාර්යාලයේ සනීපාරක්ෂක කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීමට අදාලව ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

2020 පාර්ලිමේන්තු මැතිවරණ කටයුතුවලදී ප්‍රදේශයේ ඡන්ද මධ්‍යස්ථාන විෂබීජහරණය හා විෂබීජහරණ ක්‍රියාවලිය අධීක්ෂණ කිරීම සඳහා මැතිවරණ කාර්යාලය විසින් ලබා දුන් මුදලින් රු. 33 205.00 ක මුදල සභා කාර්යාලයේ සනීපාරක්ෂක කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලද

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2020 පාර්ලිමේන්තු මැතිවරණ කටයුතුවලදී ප්‍රදේශයේ ඡන්ද මධ්‍යස්ථාන විෂබීජහරණය හා විෂබීජහරණ ක්‍රියාවලිය අධීක්ෂණ කිරීම සඳහා මැතිවරණ කාර්යාලය විසින් ලබා දුන් මුදලින් රු.33,205.00 ක මුදල සභා කාර්යාලයේ සනීපාරක්ෂක කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(v). සභාවට ගෙවිය යුතු සියළු හිඟ මුදල් ගෙවා අවසන් කිරීමෙන් අනතුරුව, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් වෙලන්හින්න ජල ව්‍යාපෘතිය ගම්වාසීන් විසින් ස්වේච්ඡාවෙන් නඩත්තු කිරීමට කැමැත්ත පල කරමින් ප්‍රජා ජල ව්‍යාපෘති සමිතියකට පවරා දෙන ලෙසට එම ජල ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයන් විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ පිළිබඳව නැවතත් අදහස් දක්වමින්,

මෙම ජල ව්‍යාපෘතිය අඩු ආදායම් ලබන ජල ව්‍යාපෘතියකි. ජල මෝටරය අක්‍රිය වන අවස්ථාවල්වලදී නැවත නඩත්තුකර යාවත්කාලීන කිරීම සඳහා වැයවන නිෂ්පාදන පිරිවැය වැඩි ය. ජල ව්‍යාපෘතියේ සිටින ජල පාරිභෝගික සංඛ්‍යාව 44 ක් වන අතර, එයින් ස්ථාවර ගාස්තුව පමණක් ගෙවනු ලබන ජල පාරිභෝගික සංඛ්‍යාව 08 කි. 2022 වසරේ මුල් කාර්තුව සඳහා බිල් කල ආදායම සහ වියදම රු. 108,438.00 කි. සමස්ත

ලාභය, අලාභය මුදලින් ලද ආදායම එකතු කල ආදායම හා වියදම 126,950.00 කි. ජල මෝටරය අක්‍රිය වූ අවස්ථාවක දී ගම්වාසීන් විසින් ඔවුන්ගේ මූල්‍යමය දායකත්වයෙන් ජල මෝටරය නඩත්තු කරවා ඇති අතර, එහිදී ජල මෝටරය ක්‍රියාත්මක කරවීමේ දී පැයක කාලයක් ජල මෝටරය ක්‍රියාත්මක කිරීමටත්, පැයක කාලයක් ජල මෝටරය අක්‍රිය කර තැබිය යුතු බවත් හැඳිනගෙන ඇති අතර, එමඟින් ජල මෝටරය අක්‍රියවීමකින් තොරව දිගු කලක් පවත්වාගෙන යාමට හැකි බව ද පෙන්වා දී ඇත. එහෙත් ඒ ආකාරයට පැයක කාලයක් ජල මෝටරය ක්‍රියාත්මක කරවීමටත්, පැයක කාලයක් ජල මෝටරය අක්‍රිය කරවීමටත් සභාවේ සේවක මහත්මයෙක් එම ජල යෝජනා ක්‍රමය තුල පමණක් රැඳවිය නොහැකි අතර, ඔවුන්ගේ සේවය වෙනත් ව්‍යාපෘති සඳහා ද ලබගත යුතු අතර, ඔවුන්ට වැටුප් ගෙවීම, අතිකාල දීමනා සහ ගමන් ගාස්තු ගෙවීම, විදුලි බිල් පියවීම, අනෙකුත් නඩත්තු කටයුතු සඳහා ජල ව්‍යාපෘතියෙන් ලැබෙන ආදායමට වඩා වියදම අධිකය. එම නිසා ප්‍රජා ජල ව්‍යාපෘතිය මඟින් සභාවට පවරා දී ඇති ජල මෝටරය, ජල නල පද්ධතියෙහි සම්පූර්ණ වගකීම ප්‍රජා ජල ව්‍යාපෘති සමිතියකට පවරා දීමටත්, සභාවට අයවිය යුතු සියලු හිඟ ජල ගාස්තු අයකරගැනීමටත් කටයුතු කල යුතුය.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් වෙලන්හින්න ජල ව්‍යාපෘතිය තුලින් සභාවට අයවිය යුතු සියළු හිඟ ජල ගාස්තු අයකරගැනීමෙන් අනතුරුව, ප්‍රජා ජල ව්‍යාපෘතිය මඟින් සභාවට පවරා දී ඇති ජල මෝටරය, ජල නල පද්ධතියෙහි සම්පූර්ණ වගකීම ගිවිසුම් ගතවීමෙන් අනතුරුව, ප්‍රජා ජල ව්‍යාපෘති සමිතියකට පවරා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය අදහස් දක්වමින්,
වෙලන්හින්න ජල ව්‍යාපෘතියේ දීර්ඝ කාලයක් තුල ගැටළු රැසක් පැවති අතර ගම්වාසීන්ගේ මැදිහත්වීම මත එම ගැටළු විසඳා ගැනීමට හැකි වුණා. මෙම ජල ව්‍යාපෘතිය සභාවේ පාලනයෙන් නිදහස් කර ප්‍රජා ජල සමිතියකට ලබා දීම සුදුසුයි.

ඒ අනුව ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් වෙලන්හින්න ජල ව්‍යාපෘතිය තුලින් සභාවට අයවිය යුතු සියළු හිඟ ජල ගාස්තු අයකර ගැනීමෙන් කිරීමෙන් අනතුරුව, ප්‍රජා ජල ව්‍යාපෘතිය විසින් සභාවට පවරා දී ඇති ජල මෝටරය, ජල නල පද්ධතියෙහි සම්පූර්ණ වගකීම ප්‍රජා ජල ව්‍යාපෘති සමිතියකට පවරා දීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(vi). වෙලන්හින්න ජල ව්‍යාපෘතියේ දැනට ජලය බෙදා හැරීම සඳහා භාවිතා කරනු ලබන ජල ටැංකිය ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, එම ප්‍රදේශයේ ගම්වාසීන්ට විධිමත් පරිදි ජල සැපයුම ලබා ගැනීම සඳහා ලීටර් 5000 ක ජල ටැංකියක් ලබා දෙන ලෙසට ඉල්ලමින් වෙලන්හින්න ප්‍රජා ජල ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයන් විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවීමෙන් අනතුරුව, ලීටර් 5000 ක ජල ටැංකියක් සභා අරමුදලින් වෙලන්හින්න ජල ව්‍යාපෘතිය සඳහා ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව වෙලන්හින්න ජල ව්‍යාපෘතියේ දැනට ජලය බෙදා හැරීම සඳහා භාවිතා කරනු ලබන ජල ටැංකිය ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, එම ප්‍රදේශයේ ගම්වාසීන්ට විධිමත් පරිදි ජල සැපයුම ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවීමෙන් අනතුරුව, ලීටර් 5000 ක ජල ටැංකියක් ලබා සභා අරමුදලින් ලීටර් 5000 ක ජල ටැංකියක් ලබා දීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(vii). ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ වසර දෙකක් අධ්‍යාපනය ලබා ඇති බවත්, එහි ප්‍රායෝගික අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කිරීම සඳහා කාර්යාල පරිපාලන කටයුතු පිළිබඳව මාස හයක සීමාවාසික පුහුණුවක් අප ආයතනය වෙතින් ලබා දෙන ලෙසට වැගපිටිය ප්‍රදේශයේ පදිංචි කේ.එම්.ජී.ටී.එල්. ඩයස් මෙනවිය විසින් 2022/09/12 වන දින කරන ලද ඉල්ලීම් ලිපියට අනුව, පළාත් ප්‍රධාන ලේකම්ගේ අනුමැතියට යටත්ව 4/2017 චක්‍රලේඛ ප්‍රකාරව පුහුණුලාභියෙකුට දෛනිකව රු. 500 ක

මුදලක් ගෙවිය හැකි බවත් ප්‍රකාශ කරමින් ඊට අදාලව ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

පළාත් ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය යටතේ මාස හයක සීමාවාසික පුහුණුවක් ලබා දීමත්, 4/2017 චක්‍රෙල්ඛ ප්‍රකාරව පුහුණුලාභියෙකුට දෛනිකව රු. 500 ක මුදලක් සභා අරමුදලින් ගෙවීම සුදුසු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව පළාත් ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය යටතේ මාස හයක සීමාවාසික පුහුණුවක් ලබා දීමත්, 4/2017 චක්‍රෙල්ඛ ප්‍රකාරව පුහුණුලාභියෙකුට දෛනිකව රු. 500 ක මුදලක් සභා අරමුදලින් ගෙවීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(viii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් පඹහින්න ජල ව්‍යාපෘතිය යටතේ ජලය ලබා ගන්නා ජල උල්පත හා හිරිකටුඔය ජල මූලාශ්‍රයෙන් ප්‍රාදේශීය සභා නල පද්ධතියට ජලය ලබා ගන්නා කවුළුව අලුත්වැඩියා කර දැල් ආවරණයක් යෙදීම, ජලය රැස්කරන කුටීරයක් ඉදි කිරීම හා බෙදාහැරීම් නල පද්ධතියේ වැල් පෙට්ටි ඉදි කිරීම යන අත්‍යාවශ්‍ය අංග වලින් යුතුව එම ජල ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමට අදාලව ඉදිරිපත් කරන ලද රු. 315,500.00 කින් යුතු ඇස්තමේන්තුව සහ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

පඹහින්න ජල යෝජනා ක්‍රමය සංවර්ධනය කිරීමත් ඒ සඳහා ඉදිරිපත් කරන ලද රු.315,500.00 කින් යුතු ඇස්තමේන්තුව අනුමත කිරීමත් සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව පඹහින්න ජල යෝජනා ක්‍රමය සංවර්ධනය කිරීමත්, ඒ සඳහා ඉදිරිපත් කරන ලද රු. 315,500.00 කින් යුතු ඇස්තමේන්තුව අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ix). ගලගම ජල ව්‍යාපෘතියේ නෙල්ලිගස්තැන්න හා සාලියමිත්‍රගම බෙදාහැරීම් නල මාර්ග සඳහා අළුතින් නල යෙදීම, වැල් පෙට්ටි ඉදිකිරීම හා තිබෙන වැල් පෙට්ටි අලුත්වැඩියා කරමින් ගලගම ජල ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමට අදාලව ඉදිරිපත් කරන ලද රු. 131817.50 කින් යුතු ඇස්තමේන්තුව සහ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගලගම ජල යෝජනා ක්‍රමය සංවර්ධනය කිරීමත්, ඒ සඳහා ඉදිරිපත් කරන ලද රු. 131817.50 කින් යුතු ඇස්තමේන්තුව අනුමත කිරීමත් සුදුසු බව ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව ගලගම ජල යෝජනා ක්‍රමය සංවර්ධනය කිරීමත්, ඒ සඳහා ඉදිරිපත් කරන ලද රු. 131817.50 කින් යුතු ඇස්තමේන්තුව අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(x). ගලගම බහුකාර්ය ගොඩනැගිල්ලේ සූර්ය බල ශක්ති පද්ධතිය සවි කිරීම කර්මාන්තයේ සවි කිරීමේ කටයුතු අවසන්කර ජාතික විදුලි බල පද්ධතියට 2022/01/19 වන දින සිට විදුලිය මුදා හැර ඇති බවට විදුලි ඉංජිනේරු විසින් සහතික කර ඇති බවත්, මෙම ව්‍යාපෘතිය අවසන් කර වසරකට අධික කාලයක් ගත වී ඇති බවත්, 2021 දෙසැම්බර් මස 02 වෙනි දින ලේකම්තුමිය වෙත ලිපියක් යොමුකර කොන්ත්‍රාත්කාර සමාගම විසින් රඳවාගත් රැඳවුම් මුදල ලබා දෙන ලෙස ඉල්ලුම්කර ඇති බව සඳහන් කරමින්, 25 % ක රැඳවුම් මුදල නිදහස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගලගම බහුකාර්ය ගොඩනැගිල්ලේ සූර්ය බල ශක්ති පද්ධතිය සවි කිරීම කර්මාන්තයේ 25 % ක රැඳවුම් මුදල් කොන්ත්‍රාත්කාර සමාගම වෙත ගෙවීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ගලගම බහුකාර්ය ගොඩනැගිල්ල තුල සූර්ය බල ශක්ති පද්ධතියක් ඉදිකිරීමට කටයුතු කළා. මෙම ව්‍යාපෘතිය අවසන් කර ජාතික විදුලි බල පද්ධතියට විදුලිය එක්කිරීම නිසා සභාවට මාසිකව දළ වශයෙන් රු. 50000.00 ක පමණ මුදලක් ආදායම් ලෙස ලැබීමට නියමිත බව විදුලි ඉංජිනේරු විසින් සහතික කර තිබෙනවා. ව්‍යාපෘතිය අවසන් කර වසරකට වැඩි කාලයක් ගත වී ඇති බැවින්, ජාතික විදුලි බල පද්ධතියට විදුලි බලය එක්කර ඇති බැවින්, රැඳවුම් මුදල නිදහස් කල හැකි ය. මෙම 25 % ක රැඳවුම් මුදල ගෙවීමට තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය ලබා ගත යුතු වුවත් මේ දක්වා එය නොලැබීම හේතුවෙන් එම මුදල නිදහස් කිරීමට නොහැකි වී ඇත. මේ සම්බන්ධයෙන් නිර්දේශය ලබා ගැනීම සඳහා යොමුකර ඇති අතර එය දින 14 ක් ඇතුළත එම කමිටු නිර්දේශය නොලැබුණහොත් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය ලැබුණා සේ සලකා 25 % ක රැඳවුම් මුදල ගෙවීමට සභා අනුමැතිය අනුව කටයුතු කරනවා.

රැඳවුම් මුදල් නිහස් නොකරන බව දන්වා ඇති බැවින් සභා අනුමැතිය මඟින් රැඳවුම් මුදල් කොන්ත්‍රාත් සමාගම වෙත ගෙවීම සඳහා සභා අනුමැතියට ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදි. ලක්ෂ 30 ක ව්‍යාපෘතියක් සඳහා රත්නපුර සිට ගලගමට ගොස් නිරීක්ෂණය කිරීමේ පරිපාලන වියදම් වශයෙන් එක්ලක්ෂ විසිපන්දහස බැගින් ඉල්ලා තිබෙනවා. නිරීක්ෂණය කිරීම ඔවුන්ගේ වෘත්තිය වුවත් ඔවුන් රැඳවුම් මුදල නිදහස් කරන්නේ නැහැ. ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් අනතුරුව, ගිවිසුම් ප්‍රකාරව අදාල මුදල ගෙවීම සභාවේ වගකීමයි. දූෂණයට එරෙහිව අතිගරු ජනාධිපතිතුමාගේ සිට ප්‍රාදේශීය දේශපාලන මන්ත්‍රීවරයා දක්වා සමස්ත දේශපාලන පද්ධතියම බැණුම් අහනවා. දෝෂාරෝපන එල්ල වෙනවා. ඒත් මෙම ව්‍යාපෘතියෙන් රුපියලක පමණ මුදලක්වත් අපි ලබාගෙන නැහැ.

මෙම මුදල් ඉල්ලන්නේ ව්‍යාපෘතිය ආරම්භ වූ දිනයේ සිට අවසානය දක්වාද? මාස කිහිපයක් සඳහාද? එසෙ නැත්නම් දින කීපයක් සඳහා දැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විමසා සිටි අවස්ථාවේ දී, එක් දිනක් සඳහා බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කිරීමත් සමඟ එක් දිනක් සඳහා මෙවැනි මුදලක් ගෙවීම අසාධාරණ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා නැවතත් නැගී සිටිමින් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා ඒ පිළිබඳව අදහස් විමසමින්,
පරිපාලන වියදම් ගෙවන ලෙසට ඉල්ලීම් කලත් ඔවුන්ට ආයතන මට්ටමින් වැටුපක් ලැබෙනවා. මෙම ඉල්ලීම අසාධාරණ බව ඉහළ නිලධාරින් දැනුවත් කලේ නැද්ද? එම නිලධාරින්ගේ අනුමැතිය නොමැතිව මෙම මුදල් නිදහස් කල නොහැකිද? සභා අනුමැතියෙන් රැඳවුම් මුදල නිදහස් කලහැකිනම් ඒ සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසුයි. රටේ සෑම තැනකම සිදුවන්නේ මෙවැනි සිදුවීම් නිසා මේ පිළිබඳව මාධ්‍ය ආයතනයකට දැනුවත් කරන්න.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ලිපි මඟින් ඉහළ නිලධාරින් දැනුවත් කලා. ජාතික විදුලි බල පද්ධතියට විදුලිය නිදහස් කර ඇති බව විදුලි ඉංජිනේරුවරයා විසින් දැනුම් දී තිබෙනවා. නිලධාරින්ට ගෙවිය යුතු පරිපාලන වියදම් ගෙවිය නොහැකි බව විගනනය මඟින් දන්වා ඇත.

මෙම ව්‍යාපෘතියෙන් මාසිකව කොපමණ විදුලියක් නිපදවන්නේ දැයි ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් විමසා සිටි අවස්ථාවේ දී මාසිකව දළ වශයෙන් රු. 50000/- ක මුදලක් වසර 25 ක් දක්වා සභාවට ආදායම් එකතු වන ව්‍යාපෘතියක් බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,

රජයේ නිලධාරීන්ට දීමනා ගෙවීමේ දී ඒ සඳහා නියමිත චක්‍රලේඛන අනුව ගෙවීම් කරනු ලබයි. එබැවින් මේ පිළිබඳව ඉහළ නිලධාරින්ගෙන් විමසුවාද? විදුලි ඉංජිනේරුවරයා හිතුමතේට මුදල් ඉල්ලුම් කරන බවක් දක්නට තිබෙනවා. එම නිලධාරින්ට ගමන් වියදම් ගෙවනවා නේද? ගෙවීම් පිළිබඳව ඔවුන්ට සීමාවන් නොමැතිද? අමාත්‍යාංශ ලේකම්තුමාගෙන් සහ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගෙන් උපදෙස් ලබා ගැනීමට හැකියාවක් නැද්ද?

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ඔවුන්ට මෙම මුදල ගෙවිය යුතුනම් ඊට අදාල චක්‍රෙල්ඛ ප්‍රකාරව හා උපදෙස් ඉදිරිපත් කරන ලෙස ඔවුන්ව දැනුවත් කර ගෙවීම් කළා. මෙරට 1948 න් පසුව මෙරට දියුණු නොවූයේත්, රට බංකොලොත් වන්නේත් මෙවැනි නිලධාරින් නිසයි. සභාව විසින් ලබාගත් සේවයට එම කොන්ත්‍රාත්කාර සමාගමට මුදල් ගෙවිය යුතු බැවින් මහ සභාවේ අනුමැතිය පරිදි ගෙවීම් කටයුතු අවසන් කිරීම දින 14 ක් ඇතුළත නිසි පිළිතුරක් නොළදහොත් ගෙවීමට කටයුතු කරන බව තාක්ෂණ සේවා ඇගයීම් කමිටුවට දැනුම් දෙනවා.

ගලගම බහුකාර්ය ගොඩනැගිල්ලේ සූර්ය බල ශක්ති පද්ධතිය සවි කිරීම කර්මාන්තයේ 25 % ක රැඳවුම් මුදල් කොන්ත්‍රාත්කාර සමාගම වෙත ගෙවීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමාගේ සහ ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

එම සාකච්ඡාවෙන් අනතුරුව, ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් විය.

කාරක සභා අවස්ථාවේ දී ලේකම්තුමිය විසින් රැඳවුම් මුදල් නිදහස් කිරීම සම්බන්ධව පවතින ගැටළු පැහැදිලි කරන ලදි. ඉන් අනතුරුව ආයතනය අපහසුතාවයට පත්ව ඇති බැවින් නිලධාරින්ගේ නිර්දේශය ලබා නොදීම ගැටළුවක් වුවත්, සමාගමට මුදල් ගෙවිය යුතු බැවින් මහ සභාවේ අනුමැතිය පරිදි ගෙවීම් කටයුතු අවසන් කිරීම සඳහා තාක්ෂණ සේවා ඇගයීම් කමිටුවෙන් විමසා රැඳවුම් මුදල් නිදහස් කිරීමටත්, පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය යටතේ නිලධාරින් සඳහා ගෙවිය යුතු මුදල් ගෙවීමටත් තීරණය කරන ලදි.

ඒ අනුව ගලගම බහුකාර්ය ගොඩනැගිල්ලේ සූර්ය බල ශක්ති පද්ධතිය සවි කිරීම කර්මාන්තයේ 25 % ක රැඳවුම් මුදල් කොන්ත්‍රාත්කාර සමාගම වෙත ගෙවීම සඳහා දින 14 ක් ඇතුළත තාක්ෂණ සේවා ඇගයීම් කමිටු තීරණය අනුව ගෙවීම් කිරීමටත් සහ පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය යටතේ නිලධාරින් සඳහා ගෙවිය යුතු මුදල් ගෙවීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(xi). 2022 වසරේ ඔක්තෝම්බර් මසට යෙදෙන ජාතික කියවීම් මාසය නිමිතිකරගෙන පාසල් සිසුන්ගේත්, ප්‍රදේශයේ ජනතාවගේත් කියවීම් රුචිය වැඩි කරවා ගැනීමටත්, පුස්තකාල සාමාජික සංඛ්‍යාව වර්ධනය කරවා ගැනීමටත් 2022/10/07 වන දින උඩගම මධ්‍ය මහා විද්‍යාලයේ සිට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව දක්වාත්, ඇල්ලේඅරාව සිට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව දක්වාත්, උඩගම මධ්‍ය මහා විදුහලේ සහ ර/ බණ්ඩාරනායක විදුහලේ සිසු දරුදැරියන් කිහිප දෙනෙකුගේ සහභාගීත්වයෙන් පොත් පෙරහැරක් පැවැත්වීමට අදාල වැඩසටහන පැවැත්වීමට අදාලව ඉදිරිපත් කරන ලද රු. 55000.00 ක වියදමකින් යුතු දළ ඇස්තමේන්තුව සහ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ජාතික කියවීම් මාසය නිමිතිකරගෙන පොත් පෙළහැරක් පැවැත්වීමත් ඒ සඳහා ඉදිරිපත් කර ඇති දළ ඇස්තමේන්තුව අනුමත කිරීමත් සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් යෝජනාව කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා අදහස් දක්වමින්,
මෙම පොත් පෙළහැර පිළිබඳව ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය දැනුවත් කිරීමට පියවර ගන්නේ නම් බොහෝ පොත් පරිත්‍යාගයන් ලබා ගැනීමට හැකියාවක් ලැබිය හැකි බැවින් දැනුවත් කිරීමට පියවර ගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වමින්,

නූතන තාක්ෂණ ක්‍රමවේදවල සංවර්ධනයත් සමඟ එම ක්‍රමවේද පරිහරණය කිරීමට යොමුවීමත් සමඟ කියවීමේ පුරුදු අත්හැරිලා. ඉතාමත් වැදගත් කාලෝචිත තීරණයක්. පොත් සමාගම් ගෙන්වා පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු කල හැකිනම් එය ඉතා මහගු ක්‍රියාවක්.

ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,
පුස්තකාල කමිටුව ඉතා සක්‍රිය කමිටුවකි. මෙහි දේශපාලන අධිකාරියට අමතරව වෛද්‍ය වෘත්තිකයන්, විදුහල්පතිවරුන්, අධ්‍යක්ෂකවරුන්, නොයෙකුත් ක්ෂේත්‍රවල විද්වතුන් කමිටු සමාජිකත්වය උසුලමින් ප්‍රදේශවාසීන්ට වටිනා සේවයක් ලබා දෙනවා. එක් අවස්ථාවකදී ශිෂ්‍යත්ව සම්මන්ත්‍රන පැවැත්වීමට කටයුතු කල අතර දමිළ භාෂාවෙන් ද  සම්මන්ත්‍රණය පැවැත්වූවා.  එහිදී දමිළ භාෂා දරුවෙකුගේ පියෙක් එම සම්මන්ත්‍රණයේ වටිනාකම පිළිබඳව මා සමඟ සාකච්ඡා කළා. ඔවුන්ගේ ජීවිත කාලය තුලම එවැනි සම්මන්ත්‍රණයකට සහභාගී නොවුන බව ප්‍රකාශ කරමින් ස්තූතිය ප්‍රකාශ කළා. ඒ සියලු වටිනාකම් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස මට හිමි වුණේ සියලුම මන්ත්‍රීවරුන්ගේ සහයෝගය සහ දායකත්වය නිසයි. පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීම සඳහා පොත් සමාගම් දැනුවත් කිරීමට කටයුතු කරනවා. එහිදී පොත් මිලදීගෙන පරිත්‍යාග කිරීමට අවස්ථාවක් උදාවෙනවා.

ඒ අනුව ජාතික කියවීම් මාසය නිමිතිකරගෙන පොත් පෙළහැරක් පැවැත්වීමත් ඒ සඳහා ඉදිරිපත් කර ඇති රු. 55000.00 ක වියදමකින් යුතු දළ ඇස්තමේන්තුව අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (06). කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

### (06). (i). ගෙවීම අනුමත කිරීම.

මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අගෝස්තු මස 01 වන දින සිට අගෝස්තු මස 31 වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක 1 - 73 සහ වවුචර් අංක 630 සිට 712 දක්වා ගෙවීම් විස්තර වාර්තා සහ වවුචර් උපලේඛන 2022.09.05. වන දින පැවැති මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මුදල් කමිටුවේ අනුමැතිය ලත් එම වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමින් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් මුදල් කමිටුවේ නිර්දේශ ලද වවුචර් වාර්තා සහ මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව මුදල් කමිටුවේ අනුමැතිය ලත් වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව අනුමත කිරීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව  සභා සම්මත විය.

### (06). (ii). ටෙන්ඩර් මණ්ඩල වාර්තාව ඉදිරිපත් කිරීම.

2022.09.05. දින පැවැති ප්‍රසම්පාදන කමිටුව විසින්,
01. එදිනෙදා කාර්යාලය සඳහා භාවිතා කරන ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.
02. ප්‍රධාන කාර්යාලයේ අවශ්‍යතා හා සනීපාරක්ෂාව සඳහා සනීපාරක්ෂක ද්‍රව්‍ය හා උපාංග මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.
03. කාර්යාලයේ අවශ්‍යතා සඳහා ආකෘති පත්‍ර මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.
03. ප්‍රාදේශීය සභාවේ Power mate WX 7000 petrol විදුලි ජනක යන්ත්‍රය අළුත් වැඩියා කිරීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමට අදාල වූ ප්‍රසම්පාදන කමිටු වාර්තාව සභා අනුමැතිය සඳහා ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර  මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## (06). (ii). නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු යෝජනා ඉදිරිපත් කිරිම.

ප්‍රදේශයේ අඩු ආදායම්ලාභි පවුල් සඳහා සෙවිලි තහඩු බෙදා දීම වෙනුවෙන් 2021/08/17 වන දින පැවැති මහා සභාවේ අනුමැතිය ලැබී ඇති අතර කොට්ඨාස 13 ක් සඳහා ඉල්ලීම් නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවට ඉදිරිපත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා දැනුවත් කරන ලද අතර, මේ සඳහා රුපියල් 400,000/- ක මුදලක් ඇස්තමේන්තු කර ඇති අතර, එක් කොට්ඨාසයකට රුපියල් 28 500/- බැගින් කොට්ඨාස 13 සඳහා වෙන් කරන ලද බවත් නමුත් මේවනතුරු ලැබී ඇත්තේ අයදුම්පත්‍ර හතරක් පමණක් වන බවත්, මේ වන විට වෙළඳපොලෙහි තහඩුවල මිල ගණන් විශාල ලෙස ඉහළයාම නිසා රුපියල් 28,500/- වැනි මුදලකට තහඩු ලබා දීම ප්‍රමාණවත් නොවන බැවින්, දැනට ලැබී ඇති අයදුම්පත් සඳහා පමණක් එක් අයෙකුට රුපියල් 60,000/- ක මුදලකට අඩි 10 සෙවිලි තහඩු 10 බැගින් සිව් දෙනෙකුට ලබා දීම සඳහා මහ සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ද්‍රව්‍ය ආධාර ලබාදිය යුතු බව ප්‍රකාශ කරන ලදි.

ලැබී ඇති අයදුම්පත් සඳහා පමණක් එක් අයෙකුට රුපියල් 60,000/- ක මුදලකට අඩි 10 සෙවිලි තහඩු 10 බැගින් සිව් දෙනෙකුට ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් ප්‍රකාශ කරන ලදි.
ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව, ලැබී ඇති අයදුම්පත් සඳහා පමණක් එක් අයෙකුට රුපියල් 60,000/- ක මුදලකට අඩි 10 සෙවිලි තහඩු 10 බැගින් සිව් දෙනෙකුට ලබා දීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## (07). ආදායම් වියදම් වාර්තාව.

2022 අගෝස්තු මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## (08). වෙනත් කරුණු.

(i). නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරිම.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා අසනීප වී ඇති බැවින් අද දින මාසික මහ සභාවට නොපැමිණෙන බව දුරකතනය මඟින් දැනුම් දී තිබෙනවා. එබැවින් එතුමන්ලාගේ නිවාඩු අනුමත කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.
ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමන්ලා නොපැමිණි බැවින් එතුමන්ලාගේ නිවාඩු අනුමත කිරිමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

(ii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
කුඩා තේවතු හිමියන් විශාල ප්‍රමාණයක් පින්නවල ප්‍රදේශයේ පදිංචිව සිටියි. විශේෂයෙන් ඔවුන්ගේ තේ දලු නිෂ්පාදනයෙන් ලැබෙන මුදල් බැංකු ගිණුමට බැර වුවත්, එම මුදල් ලබා ගැනීම සඳහා ඔවුන් විශාල වියදමක් හා කාලයක් ගත කරමින් බලංගොඩ නගරයේ බැංකු පද්ධතියට හා ඇල්ලරාව මැලිබන් ගාමන්ට් ආයතනය අසළ ඇති ATM යන්ත්‍රයට හෝ බලංගොඩ නගරය තුල ස්ථාපිතව තිබෙන ATM යන්ත්‍ර සඳහා යාමට සිදුව ඇත. එබැවින් ඔවුන්ගේ අවශ්‍යතාවය පරිදි පින්නවල නගරය තුල ATM යන්ත්‍රයක් ස්ථාපිත කිරීම අත්‍යාවශ්‍ය අංගයක් බැවින්, ATM යන්ත්‍රයක් ස්ථාපිත කර දෙන ලෙස බලංගොඩ නගරය තුල පිහිටුවා ඇති සියලුම බැංකු

කළමණාකරුවන් දැනුවත් කිරීමටත්, මහ බැංකු අධිපතිවරයා දැනුවත් කිරීමෙන් ඉතා කඩිනමින් ATM යන්ත්‍රයක් ස්ථාපිත කරවා ගැනීමට හැකියාවක් ලැබිය හැකි බැවින් එතුමා දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමි.

(iii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දක්වමින්,
කෘ.ප.නි. ස. නිලධාරිනියට කාර්යාල පහසුකම් ලබා දෙන ලෙසට සභාව විසින් ඉල්ලීම් ලිපි යොමු කළා. මෙලෙස සභාව විසින් බොහෝ ආයතන සඳහා ඉල්ලීම් ලිපි යොමු කලත්, ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමක් සිදු නොවන අවස්ථා තිබුණා. මාර්ග සංවර්ධන අධිකාරිය වෙත අවස්ථා දෙකකදී මාර්ගය දෙපස එළි පෙහෙලි කරවා දෙන ලෙසත්, රත්මලවින්න ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත පොහොර ගැටලුව සම්බන්ධව ඉල්ලීමක් යොමු කලත් ඒවා ක්‍රියාත්මක වීමක් දක්නට ලැබුණේ නැහැ. නමුත් පඹහින්න ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ප්‍රාදේශිය ගොවිජන සේවා සංවර්ධන නිළධාරි මහතා එම ඉල්ලීම සම්බන්ධයෙන් කටයුතු කලා. එබැවින් පඹහින්න ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ප්‍රාදේශිය ගොවිජන සේවා සංවර්ධන නිළධාරි මහතාට විශේෂ ස්තූතියක් පුද කිරීමට මෙය මේ අවස්ථාවක් කර ගන්නවා.

ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ සහභාගීත්වයෙන් වාර්ෂිකව සීතගල ශ්‍රී ගංගාතිලක විහාරස්ථානයේ 2022 ක් වූ සැප්තැම්බර් මස 24 වෙනි දින ලේ දන් දීමේ පිංකමක් පැවැත්වෙනවා. මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් සියලු දෙනාට ඒ සඳහා සහභාගි වන ලෙස ආරාධනා කරන අතර, ජනතාව දැනුවත් කිරීමේ කර්තව්‍ය සඳහා සහයෝගය සහ දායකත්වය සපයන ලෙසට මාධ්‍යවේදී මහතුන්ගෙන් ඉල්ලා සිටිමි.

(iv). ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා අදහස් දක්වමින්,
පහන්තුඩා ඇල්ල නැරඹීම සඳහා මෙමස 10 වෙනි දින සංචාරකයින් 500 ක 600 ක පමණ පිරිසක් පැමිණ සිටියා. එම සංචාරකයින් සඳහා ප්‍රවේශපත්‍ර 500 ක් පමණ නිකුත් කර තිබුණා. 11 වෙනි දිනත් එලෙසම විශාල සංචාරකයින් පිරිසක් පැමිණ තිබුණා. 12 වෙනි දිනත් ඊටත් වඩා සංචාරක පිරිසක් පැමිණ තිබුණත්, ප්‍රවේශපත්‍ර නිකුත් කරන ස්ථානය සහ මහජන වැසිකිළිය ඉබි යතුරු දා වසා තිබුණා. එහෙත් සංචාරකයින් වැඩි පිරිසක් පැමිණෙන දිනවලදී ප්‍රවේශපත්‍ර නිකුත් කරන ස්ථානය සහ මහජන වැසිකිළිය විවෘත කර තිබිය යුතුයි. සභාවෙන් රුපියල් ලක්ෂ 20 ක් පමණ වියදම් කර සංචාරකයින්ට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් සපයා දී තිබෙනවා. නමුත් ඔවුන්ට එම පහසුකම් භුක්ති විදීමට අවස්ථාව නොදීම සම්බන්ධයෙන් සභාවටත්, රජයටත් දොස් පවරමින් පැමිණි පිරිස ආපසු ගියා. මේ හේතුවෙන් සභාව මෙන්ම රජය ද අපහසුතාවයට පත්වෙනවා. මම නිලධාරින්ට දෝෂාරෝපනය කිරීමක් සිදු නොකරන අතර එහෙත් මේ පිළිබඳ දැඩි අවධානයක් යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

(v). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
වැගපිටිය සමෘද්ධි බැංකුව මඟින් රු. 5000/- සහනාධාර දීමනාව ලබා ගැනීම සඳහා ජනතාව සහභාගී වූ අවස්ථාවේ දී විදුලි බලය නොමැති බව ප්‍රකාශ කරමින් සහනාධාර දීමනාව ලබා දී නැහැ. එහෙත් එම ස්ථානයේ සිටි වෙනත් පුද්ගලයෙක් ජෙනරේටරය මඟින් විදුලි බලය සපයා ගැනීමට හැකි බව ප්‍රකාශ කලත්, ඉන්ධන නොමැති බව ප්‍රකාශ කරමින් අදාල නිලධාරියා නොමැති බව ප්‍රකාශ කර දීමනාව ලබා දී නැහැ. එම අවස්ථාවේ දී ලැබෙන සහනාධාර මුදලින් ඉන්ධන ලබා දෙන බව ප්‍රකාශ කරමින් සහනාධාර දීමනාව ලබා දෙන මෙන් ජනතාව ඉල්ලීම් කර තිබුණා. එවිට වෙනත් දිනයක පැමිණෙන ලෙස දන්වා තිබුණා.

ඊයේ රාත්‍රි 11.30 ට පමණ මා වෙනත් ගමනක් යමින් සිටි අවස්ථාවේදී රු.5000 සහනාධාර දීමනාව ලබා ගැනීමට වැගපිටිය සමෘද්ධි බැංකුව අසල මිනිසුන් 05 දෙනෙකු රැඳී සිටියා. ඔවුන්ට දීමනාව ලබා ගැනීමට දින ගණනාවක් පෝලිමේ රැඳී සිටින්න සිදු වෙලා. මේ පිළිබඳව සභාව දැනුවත් කරන ලෙස ඉල්ලීම් කළ බැවින් මා විසින් මන්ත්‍රීවරුන්ට දුරකතන ඇමතුම් ලබා ගත්තත් ඇමතුමට සම්බන්ධ වුණේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, දෙවටගේ ධර්මදාස මැතිතුමා පමණක් බැවින් එතුමාට මේ බව දුරකථනය මගින් දැනුම් දුන්නා.

දෙවෙනි හා තුන්වෙනි අදියරවලදී රු. 5000/- සහනාධාර දීමනාව පහසුවෙන් ලබා දීම සඳහා බැංකුව විසින් රු.100 ක මුදලක් තැන්පත් කර බැංකු ගිණුමක් විවෘත කර තිබෙනවා. වත්කම් ඇති ගම්වාසීන්ට සමෘද්ධි සහනාධාරයත්, රු. 5000 /-දීමනාවත් හිමියි. එහෙත් සමහර දුප්පත් අහිංසක ජනතාවට එක් සහනාධාරයක්වත් නැහැ. එම නිසා මේ පිළිබඳව සමෘද්ධි සංවර්ධන අධිකාරියට ලිපියක් යවමු. මේ ක්‍රමවේදය හරිම අසාධාරණයි. වාහනවලින් ඇවිත් සමෘද්ධිය අරගෙන යන අය ඉන්නවා. කිසිම සුදුසුකමක් නැති පුද්ගලයන්ට සමෘද්ධිය ලබා දීලා. මෙය සංශෝධනය කර ලැබිය යුතු පුද්ගලයන්ට ලබා දීමට කටයුතු කල යුතුයි.

නව කැබිනට් මණ්ඩලය පත් කිරීමේදී රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත් වූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී, ජානක වක්කුඹුර මැතිතුමා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යවරයා ලෙස පත් කිරීම සම්බන්ධයෙන් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් සුභ පතුම් එක් කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර ලිපියක් මගින් සුභ පැතුම් එක් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

(vi). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය අදහස් දක්වමින්,
කොට්ඨාස භාර මන්ත්‍රිවරුන් විදිහට තොරතුරු පනත මගින් සමෘද්ධි සහනාධාර දීමනාව භුක්ති විඳින්නන්ගේ නාම ලේඛනය ලබා ගැනීමට හැකියාවක් නොමැතිද? එමගින් අපට සමෘද්ධිය සහනාධාර දීමනාව අවශ්‍ය අය, අනවශ්‍ය අය පිළිබඳව, නුසුදුසු පුද්ගලයන් ඉවත් කිරීමට තීන්දු තීරණ ගනීමටත් හැකි බැවින් ඒ පිළිබඳව තීන්දු තීරණ ගෙන අනතුරුව, ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරුන්ගේ යෝජනාවක් ලෙස ඉදිරිපත් කරමු.

(vii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
කණතිරියන්වෙල සිට පල්ලේවෙල, මොරගහමංකඩ දක්වා මාර්ගය කොන්ක්‍රීට් කර ජනතාවට ගමන් කිරීමට හැකි පරිදි සංවර්ධනය කර තිබුණා. එහෙත් නැවත කාපට් කර සංවර්ධනය කිරීමට වැඩ ආරම්භ කිරීමත් සමඟ මාර්ගය අඩක් සංවර්ධනය කර නතර කිරීම හේතුවෙන් ඉතිරි කොටසේ චිප් ගල් අතුරා ඇත. වර්ෂාව හේතුවෙන් ඒවාද තැනින් තැනට එකතු වී ඇති නිසා එම මාර්ගයේ ගමන් කිරිම අතිශය දුෂ්කර හා අබලන් තත්ත්වයට පත් වී ඇත. මාර්ගය පෙර තිබූ තත්ත්වයට හෝ පත් කර දෙන ලෙස ජනතාව ඉල්ලා සිටිනවා. මෙම මාර්ගයේ ඉතිරි කොටස කාපට් නොකර හෝ තාර යොදා වාහන වලට ගමන් කිරිමට පහසු පරිදි ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙසට ඉල්ලා සිටිනවා.

හතරමංසන්ධියේ සිට වලව අද්දර, හේන්යාය දක්වා මාර්ගයේ පැතිබැම්ම ඉදිකරනු ලබන ස්ථානය මාර්ගය භාවිතා නොහැකි ආකාරයට අබලන් වෙලා. යොදා තිබුණු බෝක්කු ගලවා ඉවත් කර නැවත බෝක්කු යොදා මාර්ගය සංවර්ධනය කරනු ලබන ස්ථානය හදිසි ගංවතුර තත්ත්වයකදී එම බෝක්කු ගසාගෙන යාම සිදු විය හැකි බැවින්, එවැනි අවස්ථාවන්වලදී එහා පැත්තට යාමට හැකියාවක් නැහැ. එම නිසා මේ පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

සමෘද්ධි සහනාධාර දීමනාව ලබා දීම පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ දී කිහිප වාරයක් අදහස් ඉදිරිපත් කළා. මේ පිළිබඳව නිලධාරින් සමඟ සාකච්ඡා කල අවස්ථාවන් වලදී මන්ත්‍රිවරුන් ලබා දෙන නාම ලේඛනයට සමෘද්ධි රු. 5000 සහනාධාර දීමනාව ලබා දෙන බව ප්‍රකාශ කරමින් නිලධාරින් මා සමඟ අමනාප වූ අවස්ථාවන් ද තිබුණා. මේ සම්බන්ධයෙන් එම නිලධාරින් ඒකාධිකාරයක් පවත්වාගෙන යන බවක් දක්නට තිබෙනවා. ලැබිය යුත්තන්ට එදත් අදත් දීමනාව අහිමියි. පසුගිය කාලය තුලදී පෙජරෝ වලින් පැමිණෙන ඉහළ පැලැන්තිය නියෝජනය කරන පුද්ගලයන් සමෘද්ධිය ලැබෙනවා. ගමේ දුප්පත් ජනතාවගේ නම් නාම ලේඛනයේ පහළ දමා තිබෙනවා. එම නිසා සමෘද්ධි දීමනාව හිමි විය යුත්තන්ට ලබා දීම සඳහා නව ක්‍රමවේදයක් ඔස්සේ සුදුසු වැඩ පිළිවෙලක් සකස් කල යුතුයි.

(viii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වමින්,
සමෘද්ධි සහනාධාර දීමනාව නොලැබුණු ජනතාව ඒ පිළිබඳව අපහසුතාවයන්ට පත්වන බව දැනුම් දෙනවා. ආබාධිත සහ වයස්ගත වූවන්ට මහජන ආධාර වශයෙන් ලබා දෙනු ලබන රු.1900/- හා රු. 2000/- දීමනාව සමෘද්ධි බැංකු මගින් ගෙවීමට ඉදිරියේ දී කටයුතු කරන බවක් විශ්වාසවන්ත ආරංචි මාර්ග වලින් දැන ගන්නට ලැබුණා. මේ ආධාරය හිමි වන්නේ වයස අවු.70 ට වැඩි සහ ආබාධිත පුද්ගලයන්ට බැවින් ඔවුන්ට ළඟම පිහිටි තැපැල් කාර්යාලයෙන් මෙම දීමනාව ලබා ගැනීමට පහසුකම් සපයා තිබෙනවා. ඉදිරියේ දී සමෘද්ධි බැංකු මගින් දීමනාව ලබා ගැනීමට පහසුකම් සැලසීමෙන් විශාල වියදමක් හා කාලයක් ගත වන අතර එම දිළින්දන් තව තවත් අසරණභාවයට පත්වේ. වයෝවෘද්ධ බොහෝමයක් පිරිස අසනීප තත්ත්වයේ පසු වෙන බැවින් ඔවුන් දැඩි අපහසුතාවයන්ට ලක් වීමේ හැකියාව වැඩියි. අමාත්‍යාංශ ලේකම්වරුන් ගන්නා තීන්දු තීරණ නිසා ගමේ ජනතාව මෙන්ම මහජන නියෝජිතවරුන්ද දැඩි අපහසුතාවයට පත් වේ. මේ පිළිබඳ අපේ කණගාටුව හා ඇකමැත්ත ප්‍රකාශ කරන අතර එවැනි තීරණයක් ගැනීම පිළිබඳව වැඩිදුරටත් සොයා බලා එය වලක්වා ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමත්, ශ්‍රී ලංකා දැල් පන්දු කණ්ඩායමත් ආසියානු කුසලාන ජයග්‍රහණය කිරිම පිළිබඳව සභාවේ ප්‍රණාමය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා. ආර්ථික වශයෙන් ජනතාව පීඩාවට පත් ව සිටින

අවස්ථාවක ඔවුන්ගේ චිත්තපීඩා සමනය කිරීමට මෙම ජයග්‍රහනයන්ට හැකිවීම පිළිබඳව එම ක්‍රීඩකයන්ට ස්තූතිවන්ත වෙනවා. එමෙන්ම අපේ රටේ නිෂ්පාදනය කරන ලද ද නිවුස් පේපර් චිත්‍රපටිය ජාත්‍යාන්තරය ඉදිරියේ ඔසවා තැබීමට ක්‍රියා කල ජනප්‍රිය නලු කුමාර තිරිමාදුර හා සරත් කොතලාවල යන කලාකරුවන්ට ද අපේ ප්‍රණාමය පුද කරනවා. රටට කීර්තිය අත්කරදුන් ශ්‍රී ලාංකිකයන්ගේ ධෛර්ය පිළිබඳව සතුටුදායකයි. මේ පිළිබඳව අවශ්‍ය ආයතන දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

(ix). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, දෙවටගේ ධර්මදාස මැතිතුමා අදහස් දක්වමින්,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා ඊයේ දින රාත්‍රී 12.35 ට පමණ මා සමඟ දුරකථන ඇමතුමකින් සම්බන්ධ වුණා. ඒ අවස්ථාව වන විටත් රු. 5000/- දීමනාව ලබා ගැනීම සඳහා වෑගපිටිය සමෘද්ධි බැංකුව අසල රැඳී සිටි පුද්ලයන් පස් දෙනෙක් දින කිහිපයක් පැමිණ ඒ වෙනුවෙන් රස්තියාදු වූ බැවින් හෙට දිනයේ දී රු. 5000 දිමනාව ලබා ගැනීමට අංකයක් ලබා ගැනීම සඳහා පැමිණි බව ප්‍රකාශ කළා. මෙලෙස රස්තියාදු කිරීමකින් හා අපහසුතාවයට පත්කිරීමකින් තොරව දීමනාව ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසාදෙන ලෙසට සභාපතිතුමා දැනුවත් කරන ලෙස ඉල්ලීම් කළා.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මා නියෝජනය කරනු ලබන මද්දේගම කොට්ඨාශයේ පිඩලිගන්නාවෙල, බොරංගමුව, ගල්ගෙයාමඩ, පඹගොල්ල, හෝනමුල්ල, මාරතැන්න සහ වලේබොඩ කොට්ඨාශයේ කට්ටඩිකන්ද, රාවනාකන්ද ප්‍රදේශවල පදිංචි කරුවන් තම අවශ්‍යතාවයන් සඳහා කොළඹ, රත්නපුර වැනි ඈත ප්‍රදේශවලට ගමන් කිරිම, හදිසි අවශ්‍යතා සඳහා ගමන් කිරීම, රෝහල් ගතවීම වැනි අවස්ථාවන්වලදී අළුයම 4.00 ට පින්නවල සිට කොළඹ දක්වා ධාවනය වන බස් රථයට ගොඩවීම සඳහා රු. 1000/- ක්, රු. 1800/- ක් වැනි මුදලකට කුළී ත්‍රීවීල් රථ මඟින් පින්නවල දක්වා පැමිණීමට සිදු වී ඇත. මේ නිසා ඔවුන් දැඩි අපහසුතාවයන්ට ලක්වේ. පුදුකාටුව මංසන්දිය දක්වා මාර්ගය කාපට් කර සංවර්ධනය කර ඇති බැවින්, ජනතාවගේ කාලය, මුදල් ඉතිරිකර ගැනීම සඳහාත්, පීඩාවට සිටින එම ජනතාවට සහනයක් ලෙස මෙම බස්රථය පුදුකාටුව මංසන්දියේ සිට ගමන් ආරම්භ කිරිමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බලංගොඩ ඩිපෝ කළමණාකාරු දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

(x). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,
ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් ජල සම්බන්ධතා ලබා ගැනීම හේතුවෙන් සභාවට අයත් ගලගම ව්‍යාපෘතිය මඟින් ජල සම්බන්ධතා ලබා ගෙන ඇති ජල පාරිභෝගිකයන්ගේ ජල සම්බන්ධතා විසන්ධි කරමින් පවතින බැවින් ඒ ආසන්න නිවාස වල පදිංචිකරුවන්ට විසන්ධි කරනු ලබන එම ජල සම්බන්ධතා නැවත ලබා ගැනීමට හැකියාවක් පවතිනවාද?

කෘෂිකර්මාන්ත කටයුතුවල නියැලීම සඳහා මුඩු ඉඩම් කොටස් ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා මීට පෙර සභා වාරයකදී ඉල්ලීමක් කළා. ඒ අනුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමාට එම ඉල්ලීම ඉදිරිපත් කර තිබුණා. නැවත එම යෝජනාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත දන්වා යැවීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

උග්ගල් අලුත්නුවර කතරගම මහා දේවාලයේ වාර්ෂික පෙරහැර ආරම්භ වීමට නියමිතයි. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ඒ සඳහා සහභාගී වීමේදීත්, රථ ගාල් කිරීමේදීත් විශේෂ අවසර පත්‍ර ලබා දෙන ලෙසට නිලමේතුමා සමඟ සාකච්ඡා කරන ලෙස ඉල්ලා සිටිනවා.

සභාවට අයත් අලුත්නුවර ජල යෝජනා ක්‍රමයෙන් ජලය ලබා ගන්නා වල පාරිභෝගික ජනතාවට දින දෙකකට වරක් හෝ ජලය ලබා දීමට අවශ්‍ය කටයුතු කරන්න. එමෙන්ම අලුත්නුවර ජල යෝජනා ක්‍රමය යාවත්කාලීනව පවත්වාගන යාම පිළිබඳව කිසිඳු පැමිණිල්ලක් නොමැති බව සතුටින් ප්‍රකාශ කරනවා.

(xi). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා අදහස් දක්වමින්,
පඹහින්න ජල ව්‍යාපෘතිය වැල් පෙට්ටි යොදා ජලනල පද්ධතිය නිවැරදිව සිතියම්ගතවිය යුතුය. එතෙක් එම ජල ව්‍යාපෘතියේ සේවය සඳහා යොදවා ඇති ජල කම්කරු මහතුන් තිදෙනාම එහි රඳවන්න. එමෙන්ම පඹහින්න සහ ගලගම ජල ව්‍යාපෘතිවල ජල මනු කියවීම සඳහා යොදා ඇති නිලධාරියා මාස කිහිපයකින් සිය රාජකාරී කටයුතු සිදු නොකල බව ජල පාරිභෝගිකයන් දැනුම් දුන්නා. එම නිසා පඹහින්න සහ ගලගම ජල ගාස්තු අය කර ගැනීම සඳහා නිලධාරියෙක් පත් කරන ලෙසත් එහිදී එම නිලධාරියා උදේ කාලයේ පඹහින්නෙත් හවස කාලයේ දී ගලගම ජල ව්‍යාපෘතියෙත් ජල ගාස්තු අය කිරීම සඳහා යොදවන්න. පඹහින්න ගොවිජන සේවා

මධ්‍යස්ථානය ඒ සඳහා සාකච්ඡා කර ලබා ගැනීමට හැකියාව පවතිනවා. එම ප්‍රදේශයේ ජනතාවට මොරහැල ප්‍රධාන කාර්යාලයට පැමිණීමේ දී බස් ගාස්තුව වැඩි බැවින් සහනයක් ලෙස ලබා දිය යුතුයි.

සභාව විසින් ලබා දී ඇති ජල සම්බන්ධතාවයෙන් ස්ව කැමැත්තෙන් ඉවත් වීමට කැමැත්ත පල කරනවා. විසන්ධි කරන ලද නාම ලේඛනය පිළිබඳව තොරතුරු ලබා දී නැහැ. දවසේ එක වරුවකින් කල හැකි කාර්යයක්. අපිට කල හැකි වුවත් අපි නිවෙස්වලට ගියාම එක් ජල සම්බන්ධතාවයක් කපා හැරීමට පැමිණි බව ප්‍රකාශ කරයි. සේවකයන්ට තම රාජකාරිය වගකීමෙන් යුතුව කරන ලෙසත් නිවාඩු ඉල්ලුම්කර පෞද්ගලික රාජකාරිවල නිරත වන ලෙසත් දැනුම් දෙන්න. නිලධාරින් නිසි ලෙස තම රාජකාරි ඉටු නොකිරීම සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරන ලෙස ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ජල යෝජනා ක්‍රමවල ජල මනු කියවා මේ මාසය තුල මනු පොත් සම්පූර්ණ කර දෙන ලෙස මනු කියවන්නන් දැනුවත් කරන්න. එසේ නොකරන නිලධාරින් වෙනත් ජල යෝජනා ක්‍රම සඳහා යෙදවීමෙන් එම ජල යෝජනා ක්‍රමත් අක්‍රමිකතාවයන්ට ලක් වීමට ඉඩ ඇති බැවින් එවැනි සේවකයන් කසල කළමනාකරණ මධ්‍යස්ථානයට යෙදමෙටත් එහි සිටින සේවකයන් ජල මනු කියවීම සඳහා යෙදවීමටත් කටයුතු කරනවා. ලංකාවේ වෙනත් කිසිදු ආයතනයකින් සහන ලබා නොදෙන ආකාරයට සභාවේ සේවක මහතුන්ට විශාල වශයෙන් සහන ලබා දී තිබෙනවා. පඹහින්න ජල යෝජනා ක්‍රමයේ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් ජල සම්බන්ධතා ලබාගෙන ඇති හා සභාවේ ජල සම්බන්ධතා ලබාගත් ජල පාරිභෝගිකයන්ගේ ජල සම්බන්ධතා විසන්ධි කිරීමේ ප්‍රගතිය කාර්මික නිලධාරි මහතා මඟින් ඊ ළඟ මහ සභාවට ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන්වා. විසන්ධි කිරීමට නියමිත ජල පාරිභෝගිකයන් 17 දෙනෙකුගේ නම් ඉදිරිපත් කර තිබුණා. නිලධාරින්ගේ විනය බලධාරියා සහ පරිපාලන කටයුතු මෙහෙය වන්නේ ලේකම්තුමිය බැවින් ක්ෂේත්‍ර රාජකාරි සඳහා යොදවා ඇති නිලධාරින් රාජකාරියට පැමිණ ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා වෙනත් නිලධාරියෙක් යොදවන ලෙසත් දැනුම් දෙනවා.

(xii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
අපේ රටේ ජනතාව ඉතාම පීඩාකාරීව සිටින අවස්ථාවකදී ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයන් සහ ජාතික දැල් පන්දු කණ්ඩායමේ ක්‍රීඩිකාවන්ට ආසියානු කුසලාන ජයග්‍රහණය කිරීම පිළිබඳව සහ ඔවුන්ගේ දක්ෂතාවයන් දැක්වීම වෙනුවෙන් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ප්‍රණාමය පුද කිරීමට මෙය අවස්තාවක් කර ගන්නවා.

මේ මොහොතේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කොමිසන් සභාව රැස් වෙලා තියෙනවා. ඔවුන්ගෙන් අපේ රටේ රජයට විශාල දෝෂාරෝපනයක් එල්ල වෙනවා. අපේ රට විශාල අප්‍රසාදයකට පත් වෙලා තියෙනවා. අරගලයෙන් රටේ ජනතාව ඉල්ලු සහන වෙනුවට ජනතාව මර්දනය කිරීමට පෙළඹී තිබෙනවා. රට කුමන තත්ත්වයක තිබුණත් මේ රටේ ජනතාවට සතුටින් නැගී සිටීමට පරිසරයක් නොමැතිවීම පිළිබඳව සංවිධාන විසින් අප්‍රසාදය ප්‍රකාශ කළා. යහපත්, සාධාරණ, යුක්ති ගරුක සමාජයක් ඇති කරවා ගැනීමට ජනතාව බලාපොරොත්තු වුණා. ඒ වෙනුවට ඉතා පීඩාකාරී සමාජයක්, නීතිය ක්‍රියාත්මක විය යුතු වුවත්, කිසියම් පිරිසකට නීතිය ක්‍රියාත්මක නොවන මොහොතක මේ රටේ ජනතාව ඉල්ලන සහන වෙනුවට ජනතාව මර්ධනය කිරීමටත් පීඩාකාරී තත්ත්වයකට පත් කිරීමටත් පටන්ගෙන ඇත. රටේ ආර්ථික තත්ත්වය මෙපමණ කඩා වැටී තිබුණත්, ඒ පිළිබඳව කිසිදු සලකා බැලීමකින් තොරව, යෝධ කැබිනට් මණ්ඩලයක් පත් කර තිබෙනවා. මෙම සිද්ධීන් ලෝකය හිනස්සන සුළු කතන්දර බවට පත් වී ඇත. මෙම රජය විසින් සිදු කරන පීඩාකාරී තත්ත්වය, මර්ධනකාරී තත්ත්වය හෙළා දකින අතර ජනතාව ඉල්ලා සිටි සාධාරණ, යුක්ති ගරුක සමාජය ගොඩනැගීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

සැහෙන කාලයක් තුල නිරීක්ෂණය කල නිසා සභා වාර්තාව පිළිබඳව යම් අදහසක් ප්‍රකාශ කිරීමට මා කැමතියි. මා මීට පෙර අවස්ථාවකදීත් සභා වාර්තාව අගයීමට ලක් කළා. අද මේ මොහොත වන විට සභා වාර්තාව ඉතා උසස් මට්ටමක පවතිනවා. වාර්තාකරණයේ දී ලිඛිත භාෂාවෙන් කටයුතු කරන විට ඉදිරිපත් කරනු ලබන අදහස ඉදිරිපත් විය යුතු අතරම, එය ලිඛිත භාෂාවෙන් ඉදිරිපත් වෙන්නත් ඕන. සිංහල භාෂාව ලිඛිත භාෂාව හා වාචික භාෂාව ලෙස වාර්තාකරණයේ දී යොදා ගැනීම ඉතාමත් අපහසු කාර්යයකි. කිසියම් ඇලපිල්ලක්, පාපිල්ලක් වැරදුනොත් අදහසම වැරදියි. මාධ්‍ය වේදී මහතුන්ට ඉදිරිපත් කරනු ලබන අදහසක් ඕනෑම ආකාරයකට ඉදිරිපත් කල හැකි වුවත් වාර්තාකරණය ඉතා අපහසුයි. එහි මුඛ්‍ය අදහස ඉදිරිපත් නොවුණොත් නීතිමය තත්ත්වයන්ට පවා මුහුණ දීමට සිදු වේ. එය සභාවටත් සාධාරණව බලපානවා. මෙම නිලධාරිනිය ඉතා

හොඳින් එම කාර්යය සිදු කරන බැවින් ඒ සඳහා ප්‍රශංසාත්මක ලිපියක් ඇයගේ පෞද්ගලික ලිපි ගොනුවට එක් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා නැගී සිටිමින් නැවතත් අදහස් දක්වමින්,
රජයට මානව හිමිකම් පිළිබඳව අදාලයි. ලංකාවටත්, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවටත් මානව හිමිකම් අදාලයි. රජයක් බලයට පත් වූ අවස්ථාවකදී ඔවුන්ට පාලන කටයුතු සඳහා යම් කාලයක් ලබා දිය යුතුයි. හැමදාම උද්ඝෝෂණ කරන විට ඒ පිළිබඳව ජාත්‍යාන්තරය බලාගෙන සිටිනවා. වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිවරයා ලෙස කටයුතු කරන කාලය තුලදී එතුමාගේ නිවස, පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමාගේ නිවස, සුනිල් සභාපතිතුමාගේ නිවස, වසන්ත සභාපතිතුමාගේ නිවස ගිනිතබා විනාශ කරන විට ජාත්‍යාන්තරය බලා සිටියා. රටක් ලෙසත්, ප්‍රාදේශීය සභාවක් ලෙසත් වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මාස 06 ක් වැනි කාලයක් පාලන කටයුතු මෙහෙයවීමට අවස්ථාව ලබා දිය යුතුයි. සමගි ජනබල වේගය සජිත් මැතිතුමා පත් වුණානම් එතුමාටත්, ජ.වි.පෙ.ප. පත් වුණානම් එතුමාටත් මාස හයක කාලයක් ලබා දිය යුතුයි. පෙරටුගාමී පක්ෂයයි, ජනතා විමුක්ති පෙරමුණයි විශ්ව විද්‍යාල ළමුන් බිල්ලට දී කරගෙන යන මේ අරගලය ඉතා වැරදියි. අරගලය දෙස ජාත්‍යාන්තරය බලා සිටිනවා. අරගලය කියන්නේ ගෙවල් ගිනි තියෙන එක නෙමෙයි. මේවා මාධ්‍යයෙන් ප්‍රචාරය කරන විට රට තවත් පිරිහීමට පත් වෙනවා.

අරගලයට පහරදුන් අවස්ථාවේ දී සමගි ජනබලවේගය පක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා එම ස්ථානයට ගියා. ඒ අවස්ථාවේ දී අරගලකරුවන් ඔහුට පහර දුන්නා. නමුත් ජනතා විමුක්ති පෙරමුණේ නායකයා එම ස්ථානයට ගිය අවස්ථාවේ දී සර්ට ප්‍රශ්ණයක් නෑ, සර් එන්න කියා කිසිදු හිරිහැරයක් නොකර යන්න දුන්නා. එයින් පැහැදිලි වෙනවා මේ අරගලය මෙහෙයවන්නේ කාගේ වුවමනාවකටද කියලා. මේවා මාධ්‍යයෙන් දකින විට ජනතාවට තේරුම් යනවා සත්‍ය මොකක්ද කියලා.

නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
ජනතා විමුක්ති පෙරමුණ පමණක් නොවෙයි සෑම කෙනෙක්ම, වෛද්‍යවරු, නීතිඥවරු, කලාකරුවෝ සහ මුළු මහත් සමාජ සංහතියම උද්ඝෝෂණ සඳහා සහභාගී වුණා. අරගල කරන්නේ සාධාරණ ඉල්ලීම් දිනා ගැනීමටයි. අරලිය ගහ මැඳුරෙන් ආපු මැර පෙරහැර අරගලයට ප්‍රහාර එල්ල කළා. නීතිය ක්‍රියාත්මක කරන්න හැකිනම් හොඳයි. ගෙවල් ගිනි තැබීම් සිදු වුණා. ඔවුන්ට මෙන්ම අරගලයට මැර ප්‍රහාර එල්ල කල අයටත් නීතිය ක්‍රියාත්මක කරනවානම් හොඳයි. සොරකම, වංචාව, දූෂණය අවිනීතිභාවය පිළිබඳව අස්ථාවර ආණ්ඩු පිළිබඳව ජත්‍යාන්තරය නිරන්තර අවධානයෙන් සිටිනවා. මේ නිසා ලැබිය යුතු ආධාර මග නතර වී ඇති බව පැහැදිලියි.මඩගහන අදහස් ප්‍රකාශ කිරීමට විරෝධය ප්‍රකාශ කරනවා. ජනතා විමුක්ති පෙරමුණ නායකයා ජනතාව සමඟ සිටියා. අපි පැහැදිලිවම දන්නවා ජ.වි.පෙ.ප. මහජනයා ලක්ෂ තුනයි හිටියේ කියලා.

(xiii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින්,
මේ වැටිලා තියෙන රට නැවත නැගිටිද්දී ජනතා විමුක්ති පෙරමුණ කැමති නෑ. මේ රට හැමදාම වැටිලා තියෙන්න ඕන. ඔවුන්ගේ මතය පැහැදිලිම එයයි. එතුමාගේ කටින්ම කියවුණා. නෑ කියන්න බෑ. ඔවුන් තමයි අරගල කරන්නේ. ගෙවල් ගිනි තියපු එක හරිද? අරගල භූමියේ ගංජා හිටවපු එක හරිද? ඒවා සාධාරණීකරණය කරන්න පුළුවන්ද? ජනතා විමුක්ති පෙරමුණ එදා කල ක්‍රියාවන්ගේ ශාපය පවුල් පිටින් තවමත් විඳවනවා. රට තව අවුරුදු හතළිහකින් පමණ ආපස්සට දාන්න කැමති ඇති. ජනතා විමුක්ති පෙරමුණ ප්‍රජාතන්ත්‍රවාදය ගැනයි කතා කරන්නේ. ඒත් ඔබතුමන්ලාට ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කරන්න අයිතියක් නැහැ. අරගලයේ හිටපු අය ස.ජ.බ.ප නායකයාට ගැහුවා. ඇයි ජනතා විමුක්ති පෙරමුණ නායකයාට ගැහුවේ නැත්තේ. රට ඉදිරියට යනවට අකැමැති සමහර නලු නිළියෝත් ඉන්නවා. ඔවුන්. යටින් ඩීල් ගහනවා. ජනතා විමුක්ති පෙරමුණ කැමති නෑ මේ රට දියුණු වෙනවට. ජනතා විමුක්ති පෙරමුණ විශ්ව විද්‍යාල සිසුන් පාරට බස්සවලා අරගල කරන මුවාවෙන් මේ කරන දෙය හරි නැහැ. මැතිවරණයක් පැවැත්වුවහොත් ජනතාව තීරණය කරයි හරි දේ කුමක්ද කියලා. යම් යම් හේතුන් නිසාත්, කොරෝනා වසංගත තත්ත්වය නිසාත් රට පසුබෑමකට ලක් වුණා. ජනතාව හැමදාම මෝඩ නැහැ. නියමිත වෙලාවට පිළිතුරු ලබා දෙයි. මේ රටට ඔබතුමන්ලා ආදරෙයිනම් රට ගොඩදාන්න ඔබතුමන්ලා සහය දෙන්න. ඉඩ දෙන්න. රට හදන්න අපි උදව් කරන්න ඕන. සියලු දෙනා එකතු වෙමු. රට ගොඩ දාන්න මේ නායකයාට ඉඩ දෙන්න ඕන. ඒකාබද්ධ ආණ්ඩුවක් සැකසීමට සාකච්ඡා කලත් ඊට එකතු වෙන්නේ නැහැ. පැහැදිලිවම ඔවුන්ගේ තිබෙන්නේ කුහකකමයි. අරගලය මුවාවෙන් රටතුල සිදුකල පරිහානිය වෙනුවෙන් ජනතාව සමාවක් දෙයි කියා සිතන්නේ නැහැ. එදා ගෝඨාභය රාජපක්ෂ

මහතාත් පැවසුවා එන්න අපිත් එක්ක එකතු වෙලා මේ රට ගොඩ නගමු කියලා. රට ඉදිරියට කරගෙන යාම සඳහා වර්තමාන පාලනයට අපි ඉඩ දෙමු.

අයාලේ යන ගවයින් රැක බලා ගැනීමට කැමති පුද්ගලයෙක් ගවයින් ලබා දෙන ලෙසට සභාවෙන් ඉල්ලීම් කලා. නමුත් ඔහුට තවම නිසි පිළිතුරක් ලැබී නැහැ. ඔහු ගවයින් හදා ගන්නා පුද්ගලයෙක් බැවින් එම ඉල්ලීම සලකා බලා කඩිනමින් පිළිතුරක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වීමට නැගී සිටියත් ප්‍රාදේශීය සභා රීති අනුව සභාවේ විවාද කිරීමට අවස්ථාවක් නොමැති බව ප්‍රකාශ කිරීමත් සමඟ රටේ ජනතාව සිටින්නේ කොතනදැයි අපි දන්නා නිසා මගේ කතාව නතර කරන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

(xiv). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය අදහස් දක්වමින්,
හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මුරුංගාවත්ත මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කර තිබුණත්, එම මාර්ගයේ බස් රථයක් ගමන් නොකිරීම හේතුවෙන් පාසල් ළමුන්ට දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින් පාසල ආරම්භවන අවස්ථාවේ දී පාසලට යාමේදීත් , පාසල් අවසන් වන අවස්ථාවේ දී නැවත නිවාස වලට පා ගමනින් ගමන් කිරීමට සිදු වී ඇත. ඒ අනුව පාසල් වේලාවට හෝ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් බස් රථයක් එම මාර්ගයේ ධාවනයේ යෙදවීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සහ අදහස් සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා පිළිතුරු සහ විසඳුම් ලබා දීමට අදහස් දක්වමින්,

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වීම අනුව,
කුමන හෝ මන්ත්‍රීවරයෙකුට සභාව තුල කතා කිරීමට අවස්ථාව ලබා නොදෙන බව සිතන්නේනම් එය වැරදියි. ඉඹුල්පේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් ජනතාවගේ ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මහජන නියෝජිතවරුන් ලෙස පත් කර තිබෙනවා. වගකීම ද එයයි. සභාව තුල පක්ෂ විපක්ෂ භේදයක් නැහැ. සභාපති, උප සභාපති, මන්ත්‍රිවරුන් නියෝජනය වේ. සභාවේ රීති අනුව මන්ත්‍රිවරුන් කතා කල යුතුයි. මානව හිමිකම්, පාර්ලිමේන්තුව, ලෝකය, පළාත් සභා කතා කිරීමෙන් පලක් නැහැ. සභා බල ප්‍රදේශයේ කුඩා වපසරිය තුල පවතින ප්‍රශ්න සභාව තුල කතා කරන්න ඕන. පක්ෂ හා විපක්ෂ වශයෙන් කණ්ඩායම් ගතවී සිටින බැවින් සියලුම මන්ත්‍රිවරුන්ට ජනතා ගැටළු ඉදිරිපත් කල හැකියි. මානව හිමිකම් හෝ ජාතික ප්‍රශ්න කතා කිරීමෙන් පලක් නැහැ. එක්සතින්ගේ සංවිධානයට බලපෑම් කිරීමට අපට හැකියාවක් නොමති අතර ඒ සඳහා වෙන වෙනම ආයතන තියෙනවා. මානව හිමිකම් සම්බන්ධයෙන් අපට කිසිදු බලපෑමක් කල නොහැකියි. මන්ත්‍රිවරුන් සියලු දෙනාටම තම අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා. ඒත් අදාල දේ පමණක් කතා කරන්න. මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මේ සභාවට අදාල දේ පමණක් කතා කරන්න කියලා.

ලේකම්තුමියත් විෂයභාර නිලධාරිනියත් සභා වාර්තාව සකස් කිරීම සඳහා විශාල කැප කිරීමක් සිදු කරනවා. යෝජනා සහ අදහස් ලිඛිතව ඉදිපත් කල යුතු වුවත් වාචිකව ඉදිරිපත් කරන නිසා යම් යම් ගැටළුකාරී තත්ත්වයන් උද්ගත වන අතර සභා වාර්තාව නිවරදිව සකස් කිරිමේ දී සභාව නියෝජනය කරන මන්ත්‍රිවරුන්ගේත් යම් යම් අඩුපාඩු පවතිනවා. පසුගිය කාලය තුලදී සභාව ආරම්භ කල අවස්ථාවේ සිට විනාඩි 15 ක 20 ක දිගු කාලයක් පසුගිය සභා වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා කාලයක් ගත වුණා. නමුත් වර්තමානයේදී ඉතා කෙටි කාලයක් තුල සංශෝධන ඉදිරිපත් වී එම කටයුතු නිමා වෙනවා. මේ වෙනුවෙන් ලේකම්තුමියටත්, විෂයභාර නිලධාරිනියටත් ස්තූතිය පුද කරන අතර, විෂයභාර නිලධාරිනියගේ පෞද්ගලික ලිපි ගොනුවට ප්‍රශංසාත්මක ලිපියක් යොමු කරන ලෙසට ලේකම්තුමියට උපදෙස් ලබා දෙනවා.

ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් සාමාන්‍ය ජනතාව අරගල කළා. ගෑස් ,කිරිපිටි, තෙල් ආදී ප්‍රශ්ණ වලට විසඳුම් සෙවීමට ඔවුන් අරගල කලා. අපි අරගල නොකළාට මානසිකව හෝ එයට කැමැත්තෙන් සිටියා. නමුත් පසු වන විට දේශපාලන අභිප්‍රායන් ඉටු කරගැනීම සඳහා යම් යම් කණ්ඩායම් මේ අරගලය අතට ගැනීම නිසා අරගලය විනාශ වුණා. මා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාපතිවරයා ලෙස පත් වූ දවසේ සිට මේ දක්වා එක රුපියල් පහකින්වත් අල්ලස් ලබාගෙන නැහැ.

ජනාධිපති මන්දිරේට, රූපවාහිනී සංස්ථාවට, දෙරණ මාධ්‍යය ජලයට බලෙන් ඇතුළු වී අරගලය වෙනත් අකාරයකට ක්‍රියාත්මක වුණා. ගාලු මුවදොර අරගලයට සහභාගි වූ අයට පහර දූ අයට දඬුවම් දිය යුතු අතර, රාජ්‍ය දේපල විනාශ කිරීම, වෙල් ගිනි තැබීම් සඳහා ද දඬුවම් ලබා දිය යුතු බව මගේ මතයයි. සියලු දෙනාටම වරදේ ප්‍රමාණයට නීතිය ක්‍රියාත්මක කල යුතු බවයි. එම නිසා ඊලඟ සභාවාරයේ දී බල ප්‍රදේශයට අදාල ගැටළු පිළිබඳව පමණක් කතා කරිමට සහ ඒවාට විසඳුම් සෙවීමට උත්සාහ කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
කොරෝනා වසංගත තත්ත්වය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් පින්නවල නගරය කඩිනමින් සංවර්ධනය කිරීමේ කටයුතු ප්‍රමාද වුණා. පින්නවල නගරය තුල ATM යන්ත්‍ර ස්ථාපිත කිරීම ජනතාවට අත්‍යාවශ්‍ය අංගයක් බැවින් ඒ සම්බන්ධයෙන් මහ බැංකු අධිපති සහ බලංගොඩ නගරයේ සියලුම බැංකු කළමනාකරුවන් දැනුවත් කිරීමට පියවර ගන්නවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
යම් කාරණයක් සම්බන්ධයෙන් සභාව විසින් ආයතනයකට ලිපියක් යොමු කල අවස්ථාවකදී ඊට අදාලව පිළිතුරු ලබා දීම හෝ එහි තත්ත්වය පැහැදිලි කිරීම ප්‍රශංසනීයයි. පඹහින්න ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ප්‍රාදේශීය ගොවිජන සේවා සංවර්ධන නිලධාරී මහතා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කල හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකි. එතුමාට ස්තූතිවන්ත විය යුතු යි.
වාර්ෂිකව සීතගල ශ්‍රී ගංගාතිලක විහාරස්ථානයේ පැවැත්වෙන ලේ දන් දීමේ පිංකම සඳහා මහජන නියෝජිතවරු ලෙස හැකියාවක් පවතින සියලු දෙනා සහභාගි වන්න.

ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
පහන්තුඩාවඇල්ල නැරඹීමෙන් සභාවට රැස්කරගැනීමට හැකි ආදායම් අහිමිකරගැනීම පිළිබඳව සොයා බලන්න. සභාවට රැස්කර ගැනීමට නියමිත ආදායම් අහිමි කර ගනිමින්, ඉදිරි වර්ෂය සඳහා ආදායම් ගැසට් කිරීම තුලින් ජනතාවට පීඩාවක් වන පරිදි ජල ගාස්තු, වෙළඳ බලපත්‍ර ගාස්තු මඟින් සභාවට ආදායම් වැඩි කර ගත යුතු නැහැ. තමන්ට පැවරී ඇති රාජකාරි කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක කරන ලෙසත්, එසේ නොවන අවස්ථාවල් වලදී ඒ සඳහා විනයානුකූල ක්‍රියාමාර්ග ගන්නා බවත් ඒ බව නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අවවාද කරන ලෙසත් ලේකම්තුමියට දැනුම් දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමාගේ අදහස් දක්වීම අනුව,
නව කැබිනට් මණ්ඩලයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යවරයා ලෙස දිවුරුම් දුන් ගරු ජානක වක්කුඹුර මැතිතුමාට ලිපියකින් සුභ පැතුම් එක් කිරීමට කටයුතු කරනවා.
අත්‍යාවශ්‍යයෙන්ම සමෘද්ධි දීමනාව ලැබිය යුතු ජන කොට්ඨාශයක් සිටිනවා. ඒ අයට සමෘද්ධිය ලැබිය යුතු අතර සමෘද්ධි දීමනා සම්බන්ධයෙන් පවතින අක්‍රමිකතා සම්බන්ධයෙන් මහජන නියෝජිතවරුන් ලෙස අප සියලු දෙනා වගකීමට බැඳෙන අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා ඊට සම්බන්ධ නොවුණු බව ප්‍රකාශ කරන බැවින් එතුමා හැර. නැවත සමෘද්ධි සහනාධාර දීමනාව ලබා දෙන අවස්ථවල්වලදී අපි මහජන නියෝජිතයෝ ලෙස අපේ පාක්ෂිකයින්ට පමණක් නොව සුදුසුම පුද්ගලයින්ට එම දීමනාව ලබා දීමට කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමියගේ අදහස් දක්වීම අනුව,
සමෘද්ධිලාභින්ගේ නාම ලේඛණයක් ලබා ගැනීමට තොරතුරු දැන ගැනීමේ පනත අවශ්‍යය වන්නේ නැහැ. මහජන නියෝජිතවරු ලෙස තම කොට්ඨාසයට අදාල සමෘද්ධිලාභීන්ගේ නාම ලේඛණයක් ලබා ගැනීම සඳහා ප්‍රාදේශිය ලේකම් දැනුවත් කිරීමෙන් අනතුරුව ඉල්ලුම් කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දැක්වීම අනුව,
නැවත මාර්ග සංවර්ධන කටයුතු ආරම්භ නොකරන බවත්, ඒබීසී යොදා ඇති මාර්ග සම්බන් අවධානය යොමුකර එම මාර්ග තාර යොදා වාහන ගමන් කල හැකි අයුරින් සකස් කර දිය හැකි බව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දැනුම් දුන්නා. එහෙත් කණතිරියන්වෙල සිට පල්ලේවෙල, මොරගහමංකඩ දක්වා මාර්ගය අති දුෂ්කර මාර්ගයක් බැවින් ඒ පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරි දැනුවත් කිරීමට පියවර ගන්නවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
අවුරුදු 70 ට වැඩි වයස්ගත පුද්ගලයින්ට සහ ආබාධිත පුද්ගලයන්ට රු.1900/- මහජන ආධාර- රු.2000/- මහජන ආධාරය ලබා දෙන බැවින්, ඔවුන් මේ අවස්ථාව වන විට ළගම පිහිටි තැපැල් කාර්යාලයෙන් අපහසුතාවයකින් තොරව එම මහජනාධාරය ලබා ගන්නා බැවින්, ඉදිරියේදීත් ඔවුන් අපහසුතාවයට පත් නොවන ආකාරයට එම ආධාර තැපැල් කාරයාලය තුලින්ම දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත් එම ස්ථානය වෙනස් නොකිරීමට පියවර ගන්නා ලෙසත් අදාල ස්ථාන වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වීම අනුව,
ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායම හා ජාතික දැල් පන්දු කණ්ඩායම ආසියානු කුසලානය ජයග්‍රහනය කරමින් රටට අභිමානයක් සහ කීර්තියක් අත්කර දීම සම්බන්ධයෙන් ඔවුන්ට සුභ පැතුම් එක කල යුතුය. එමෙන්ම ජතාත්‍යන්තර සිනමා උළෙලකදී හොඳම නළුවා සහ නිළියට හිමි සම්මාන ලංකාවට දිනා දීමට එම කලාකරුවන්ට හැකි වුණා. ඔවුන්ට සුභ පැතුම් පත් එක් කල යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, දෙවටගේ ධර්මදාස මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
පින්නවල සිට කොළඹ දක්වා ධාවනය වන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් බස් රථය ප්‍රදේශයේ ජනතාවගේ පහසුව සඳහා පුදුකාටුව මංසන්ධියෙන් ගමන් ආරම්භ කර කොළඹ දක්වා ධාවනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට බලංගොඩ ඩිපෝ කළමණාකරු දැනුවත් කිරීමට පියවර ගන්නවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
ප්‍රාද්ශිය සභාව විසින් ජල සම්බන්ධතා ලබා දෙන ක්‍රමවේදය ඔස්සේ ඉල්ලුම්කරුවන්ට ජලය ලබා දීමට කටයුතු කරනු ලැබේ. එබැවින් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් ජල සම්බන්ධතා ලබා නොගන්නා ඕනෑම ඉල්ලුම්කරුවෙකුට ජලය ලබා ගැනීමට හැකියාව පවතින බැවින්, ජල සම්බන්ධතා ලබා දිය හැකි ස්ථානයක් නම් විධිමත් පරිදි ඉල්ලීම් කරන ලෙස දැනුම් දෙන්න.
උග්ගල් අලුත් නුවර කතරගම මහා දේවාලයේ පෙරහැරට සහභාගී වීම සඳහා මන්ත්‍රීවරුන්ට විධිමත් ආරාධනා පත්‍රයක් හා රථ ගාල් කිරිමේ බල පත්‍රයක් ලබා දීම පිළිබඳව පෙරහැර පැවැත්වීම පිළිබඳ රැස්වීමේ දී බස්නායක නිළමේතුමා සමඟ සාකච්ඡා කළා. ඒ අනුව ලබා දී ඇති කොන්දේසි අනුගමනය කරන්න. මන්ත්‍රීවරුන් සුදුසු ආකාරයට රාත්‍රි 7.00 ට පෙර පූජා භූමියට පැමිණෙන්න. අවසර පත්‍රයක් තිබුණ ද රාත්‍රි 9.00 ට, රාත්‍රි 10.00 ට පමණ රථ වාහන පූජා භූමියට ඇතුල් කිරීමට අවසර නැත. ඒ වගේම එම ස්ථානයට නොගැලපෙන අයුරින් නොපැමිණෙන ලෙසත්, එම නිළධාරින් සමග සහයෝගයෙන් කටයුතු කරන ලෙසත් දන්වා සිටිනවා. අනිවාර්යෙනම අවසරපත්‍රයක් ලබා දීමට කටයුතු යොදනවා.
කෘෂිකර්මාන්ත කටයුතුවල නියැලීම සඳහා මුඩු ඉඩම් කොටස් ලබා ගැනීම පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.
සභාවට අයත් ජල ව්‍යාපෘතිවල ජල ප්‍රශ්න අඩුම ජල යෝජනා ක්‍රම ලෙස අලුත්නුවර සහ පින්නවල ජල යෝජනා ක්‍රම නම් කල හැකිය. ඒ ව්‍යාපෘති සඳහා යොදවා ඇති නිලධාරින් ඔවුන්ට පවරා ඇති රාජකාරිය හොඳින් ඉටු කරනවා. අලුත්නුවරල යෝජනා ක්‍රමය තුලින් ජලය ලබා ගන්නා ජල පාරිභෝගිකයන් සඳහා හදිසි විදුලි බිඳ වැටීමක් හෝ ජලනල පළුදුවීමක් සිදු නොවුණොත් දවස් තුනකට වතාවක් ජලය බෙදා හැරීමේ කටයුතු සිදු කරනවා. නමුත් පෙරහැර මංගල්‍ය පැවැත්වෙන දින වලදී, පෙරහැර සඳහා පැමිණෙන ජනතාවගේ සහ නැටුම් කණ්ඩායම් වල අවශ්‍යතා සඳහා ජලය ලබා දීමේ අරමුණින් පූජා භූමිය තුල සහ පෙරහැර වීදිය අවට නිවෙස් සඳහා දිනපතාම හවස 2.00 සිට අලුයම 2.00 දක්වා අඛණ්ඩව ජල සැපයුම ලබා දීමට කටයුතු කරනවා. නමුත් පෙරහැර දින පහ හැරුණු විට ඉතිරි දින වලදී දින තුනකට වතාවක් ජල සැපයුම ලබා දීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමියගේ අදහස් දැක්වීම අනුව,
හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මුරුංගාවත්ත මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමත් සමඟ එම ප්‍රදේශවාසී ජනතාවගේත්, පාසල් යන දූ දරුවන්ගේත් පහසුව සඳහා එම මාර්ගයේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් බස් රථයක් ධාවනයේ යොදවන ලෙස බලංගොඩ ඩිපෝ කළමනාකරු වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමාගේ අදහස් දැක්වීම පරිදි,
අයාලේ සැරිසරණ ගවයින් ලබාදෙන ලෙසට ලිඛිත ඉල්ලීමක් සිදු කර නැහැ. මේ පිළිබඳ විෂය නිළධාරි දැනුවත් කර තිබෙනවා. අයාලේ මහ මඟ සැරිසරණ ගවයින් විධිමත් පරිදි ඉල්ලුම්කරුවන් වෙත ලබා දීම සඳහා ක්‍රමවේදයක් පවතින බැවින්, ග්‍රාම නිළධාරි මඟින්, පශු වෛද්‍ය නිළධාරි මඟින්, ප්‍රාදේශීය ලේකම්තුමිගේ අත්සනින් යුතුව ලිඛිත ඉල්ලීමක් සිදු කරන ලෙස එම ඉල්ලුම්කරුවාට දැනුම් දෙන්න.
ජ.වි.පෙ.ප. විසින් සිදු වූ භීෂණ කාලය තුල සිදු දේවල්වල අමිහිරි අත්දැකීම් පිළබඳව, එම පීඩනය විඳදරාගත් අය ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා එතුමාගේ අදහස් ප්‍රකාශ කළා. ඡන්දය ප්‍රකාශ කළොත් අත කපනවා කිව්වා, මරණයක් සිදු වුණොත් දණහිසෙන් උඩට උස්සන්න දෙන්න බෑ කිව් අයගේ පිරිස ප්‍රජාතන්ත්‍රවාදය කතා කරනවා. ඔවුන්ට ඡන්දයක් ජයග්‍රහනය කර බලයට එන්න බැහැ. ඉතිහාසයේ දත්, වර්තමානයේදීත්, අනාගතයේදීත් බලයට එන්න බැහැ. මෙරට ජනතාව එන්න දෙන්නේ නැහැ.

(09). මී ළඟ සභා වාරයට දින නියම කිරීම.
ඊළඟ සභා වාරය ඔක්තොම්බර් මස 11 වන අඟහරුවාදා දින පැවැත්වීමට කටයුතු කරනවා.

(10). ස්තූති කතාව හා අවසානය.
හත්වන සභාවේ පනස් පස්වන සභාව සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ නිලධාරින් සියළු දෙනාටත්, මාධ්‍යවේදී මහතුන් සියළු දෙනාටත්, මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමි.

ඉන් අනතුරුව, පෙ.ව. 11.45 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

එස්. ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත්,
සභාපති,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.